# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 83 — 1973 ඔක්තෝබර් 26 වැනි සිකුරාද — 1973.10.26**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලැබේ)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 1061 | ආදායම හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| කනකුරු—ඇබෑර්තු ... ... ... | 1063 | අය–වැය ලේඛන ... ... ... | 1066 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1065 | දේපල විකිණීම ... ... ... | 1073 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... | 1074 |


සැළකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාමාවලියක්ද පළවේ.

## පළාත් පාලන නිවේදන

එල් ජී/සීවී/10/38

**සුළු නගර සභා ආඥාපනත**

183 වන වගන්තිය යටතේ ආඥාව

1968 අංක 42 දරන පනතින් සංශෝධිත (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 183 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ වැඩබලන ඇමති විලියම් නීල් ද අල්විස් වන මම ඉහත කී වගන්තිය යටතේ පන්ඩතෙරිප්පු නගරය සම්බන්ධයෙන් පනවනු ලැබ 1973 මාර්තු 14 වැනි දින අංක 50/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවේ අන්තිම ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් 1973 නොවැම්බර් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එම ආඥාව මෙයින් සංශෝධනය කරමි:—

"(ආ) ඒ නගරය සඳහා එකී ආඥාපනත යටතේ අලුත් සුළු නගර සභාවක් සංස්ථාපනය කරනු ලබන තුරු, පන්ඩතෙරිප්පු නගරයේ කටයුතු පාලනය කිරීම පිණිසද, ඒ කාර්යය සඳහා එකී ආඥාපනත යටතේ සුළු නගර සභාවක බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ යුතුකම් ඉටු කිරීම පිණිසද, විශේෂ කොමසාරිස්වරයා විශයෙන් චංකානෙයි ප්‍රාදේශීය උප දිසාපති එස්. අරුනාසලම් මහතා පත් කරමි."

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ වැඩබලන ඇමති.

1973 ඔක්තෝබර් මස 9 වැනි දින,
කොළඹ දී ය.

10-958 —73. 10. 26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1973 ජනවාරි මස 7 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාව**

**ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත**

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වන වගන්තියෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් පනවනු ලැබූ රීතිය.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
වැඩබලන අමාත්‍ය.

1973. 9 මස 24 දින,
කොළඹ දීය.

**රීතිය**

1943 අප්‍රේල් මස 9 වැනි දින අංක 9,108 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ රීතියෙන් අන්තිම වරට සංශෝධිත, 1919 අප්‍රේල් 4 වැනි දින අංක 7,004 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ (176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත යටතේ පනවනු ලැබූ රීතිවල අ3 වැනි රීතිය වෙනුවට පහත දැක්වෙන අළුත් රීතිය ආදේශ කිරීමෙන්, කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාවේ පරිපාලන සීමාව තුළ වූ ප්‍රදේශයට අදාලවන තාක් දුරට ඒ රීතිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" අ 3 (1) ගාස්තු අයකර මහජනයා ඇතුළු කරගෙන ප්‍රසිද්ධ රඟ දැක්වීම් සඳහා ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් පාවිච්චි කිරීම සඳහා බලපත්‍රයන් ඉල්ලුම් කරන අයදුම්කරුවකු, ඔහුට ඒ සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම සභාවට පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගණන් බලනු ලැබූ මුදලක් ගෙවිය යුතුය :—

| | එක් දිනකට | | එක් සතියකට (දින 7ක් හෝ ඊට අඩු) | | මාසයක් හෝ (ඉන් කොටසක්) | | දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වන වර්ෂයකට | |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 කට වැඩි නොවන කල්හි ... | 10 | 0 ... | 25 | 0 ... | 50 | 0 ... | 250 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 කට වැඩි නමුත්, 399 කට නොවැඩි කල්හි ... ... ... | 15 | 0 ... | 35 | 0 ... | 75 | 0 ... | 350 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 399 කට වැඩි නමුත්, 499 කට නොවැඩි කල්හි ... ... ... ... | 25 | 0 ... | 50 | 0 ... | 100 | 0 ... | 400 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 499 කට වැඩි කල්හි ... | 30 | 0 ... | 75 | 0 ... | 150 | 0 ... | 500 | 0 |
| ව්‍යාපාරයක් ලෙස නොව, ආගමික, අධ්‍යාපනික හෝ පුණ්‍ය කටයුත්තකට ආධාර ලබාගැනීම සඳහා කෙරෙන රඟ දැක්වීම් සඳහා ... ... | 10 | 0 ... | 25 | 0 ... | 100 | 0 ... | — | |

(2) සභාවේ මතය අනුව ගිනි ගන්නා සුළු ද්‍රව්‍යවලින් සාදනු නොලැබූ ගොඩනැගිලි හෝ ඉදි කිරීම් සඳහා පමණක් වාර්ෂික බලපත්‍ර ප්‍රදානය කළ හැකිය.

10–968—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

**ගම්සභා ආඥාපනත**

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම් සභා ආඥාපනතෙහි 13 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, මහනුවර දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස්, මුතු බණ්ඩාර සමරකෝන් වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ගඟපළාත ගම්සභාවේ අංක 19 දරණ කොට්ඨාශයේ සභික, ආර්. ඇම්. පී. බී. කවිරත්න මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සැහීමට පත්ව, මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ගඟපළාත ගම්සභාවේ අංක 19 දරණ කොට්ඨාශයේ සභික ආර්. ඇම්. පී. බී. කවිරත්න මහතා, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට සාමාජිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ඇම්. බී. සමරකෝන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මහනුවර දිස්ත්‍රික්කය.

1973 ඔක්තෝබර් මස 10,
මහනුවර, පළාත් පාලන කාර්යාලයේ දී ය.

10-879—73. 10. 26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

**ගම්සභා ආඥාපනත**

13 වන වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පණතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපණතෙහි 13 (1) වන වගන්තියෙන් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර මාතලේ සහකාර පළාත් පාලන කොමසාරිස්, කඹුරුගොඩ ගමගේ ඩිවා විමලසිරි වන මම, මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන් සිය පත්තුව ගම්සභාවේ අංක 14 දරණ කොට්ඨාශයේ සභික යූ. ඩබ්ලිව්. බණ්ඩාරනායක මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කරගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සැහීමකට පත්ව, මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන් සිය පත්තුව ගම්සභාවේ අංක 14 දරණ කොට්ඨාශයේ සභික යූ. ඩබ්ලිව්. බණ්ඩාරනායක මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට සාමාජිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

කේ. ජී. ඩී. විමලසිරි,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
මාතලේ.

1973. 10. 15 දින,
මාතලේ දී ය.

10-873—73. 10. 26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබාගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ වෙනුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය**

පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙලකොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ.පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදලවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡෙදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—.

අවුරුදු :————. මාස :————. දින :————.

(ආ) උපන් දිනය :—.

| | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ. පො. ස. (උසස් පෙළ):—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දුරු තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ?

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ?

16. වෙනත් විස්තර (විශේෂඥිම්කම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා, නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරු ගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැපෑ. 530, කොළඹ 1.

---

**අවිස්සාවේල්ල නගර සභාව**

වින් නඹු මාතා තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අවිස්සාවේල්ල නගර සභාවේ සභාපති අයදුම්පත් කැඳවයි.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 696—30×11 හා 12×1—රු. 1,038. මෙම වැටුප් ක්‍රමයට අදාළ වන ඒකාබද්ධ වැටුප් ක්‍රමය යටතේ වැටුප් ගෙවන අතර, රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් සහ කොන්දේසි අනුව විවාහක නිලධාරීන්ට විවාහක දීමනාවන් ද ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම් :—

(i) (ඒ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ (බී) දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය හෝ, (සී) ඊට සම හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

(ii) උස අඩි 4කුත් අඟල් 10 ට අඩු නොවිය යුතුය.

(iii) වෛද්‍ය වත්තිකයන්, ඖෂධවේදීන් සහ වින් නඹු මව්වරුන් පිළිබඳ ආඥපනතේ 8 වන කොටස යටතේ ලියාපදිංචි වී සිටිය යුතුය. (105 වන පරිච්ඡේදය)

(iv) අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(v) අවිස්සාවේල්ල නගර සභා සීමාව තුළ ස්ථිර පදිංචිය තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

4. ඉල්ලුම්පත්‍ර පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, අවශ්‍ය සහතිකවල පිටපත් ද සමග 1973.11.30 වැනි දිනට හෝ ඊට පළමු අවිස්සාවේල්ල නගර සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

5. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ නගර සභාවේ සභාපති නමට මිස, පෞද්ගලික නමට නොවේ.

6. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගත් නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ආර්. එල්. ඒ. එස්. ඇලෝසියස්,
සභාපති,
අවිස්සාවේල්ල නගර සභාව.

1973 ඔක්තෝබර් මස 08 දින,
අවිස්සාවේල්ල නගර සභා කාර්යාලයේ දී ය.

10-897—73. 10. 26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් පාලන සේවය**

ප. පා. ලේකම්වරුන්ගේ සේවයේ V වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—73.11.17

ඉහත සඳහන් විභාගය අවලංගු කර ඇති බව සියළුම විභාග අපේක්ෂකයින් වෙත මෙයින් දන්වනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
ප. පා. සේ. කො. සභාව.

1973 ඔක්තෝබර් මස 17 දින,
තැ. පෙ. 530—කොළඹ.

10-888—73. 10. 26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

# අය-වැය ලේඛණ

## දෙවිනුවර නගරය

මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

**1973 අයවැය ලේඛනය (සාමාන්‍ය)**

1973 අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරිවේයැයි ගණන් බලන ලද පහත දැක්වෙන ශීර්ෂ යටතේවූ මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂවලට මාරුකර අවශ්‍ය වී තිබෙන වැය ප්‍රතිපාදනය කිරීමට 1973 ඔක්තෝබර් මස 16 වැනි දින අංක 413 දරණ තීරණයෙන් සම්මත කරමි.

| ඉතිරි මුදල් වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) සාමාන්‍ය වියදම් :— | | |
| (1) නිලධාරි වැටුප් : | | |
| (බී) ලිපිකරු මණ්ඩලය ... ... | 1,000 | 0 |
| (ඇෆ්) විශ්‍රාම වැටුප්... ... ... | 500 | 0 |
| (ජේ) විවාහ දීමනා ... ... | 1,000 | 0 |
| (2) කාර්යාලීය වියදම් : | | |
| (සී) අයකැමි ගාස්තු ... ... ... | 1,200 | 0 |
| (ඊ) නීති උපදේශක ගාස්තු ... ... | 400 | 0 |
| (ජී) රථවාහන තහඩු ... ... | 350 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) සාමාන්‍ය : | | |
| (සී) දීමනා ... ... ... | 100 | 0 |
| (ඇෆ්) විෂ නාශක බෙහෙත් ... ... | 300 | 0 |
| (ජේ) සෞඛ්‍ය සති සඳහා දීමනා ... ... | 150 | 0 |
| (කේ) කිරි පරීක්ෂණය ... ... | 50 | 0 |
| (7) ප්‍රසිද්ධ වෙළඳසැල් හා ගාල් : | | |
| (බී) නඩත්තුව ... ... ... | 2,000 | 0 |
| ජේ.—කියවීම්ශාලා හා පොත්ගුල් :— | | |
| (1) වැටුප් ... ... ... | 74 | 80 |
| එකතුව ... | 7,124 | 80 |

| අමතර මුදල් වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(2) කාර්යාල වියදම් :— | | |
| (බී) ගමන් වියදම් ... ... ... | 478 | 0 |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ දැන්වීම් සහ මුද්දර ... | 1,750 | 0 |
| (ජේ) හදිසි වියදම් ... ... ... | 350 | 0 |
| (ඇම්) නිල ඇඳුම් ... ... ... | 115 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (2) කුණු කසළ ශෝධනය : | | |
| (ඒ) වැටුප් ... ... ... | 3,000 | 0 |
| (7) ප්‍රසිද්ධ වෙළඳසැල් හා ගාල් : | | |
| (පී) ණය ගෙවීම් ... ... ... | 1,400 | 0 |
| ඊ.—මහජන විනෝදය :— | | |
| (7) පරීක්ෂක දීමනා ... ... ... | 4 | 0 |
| ජේ.—කියවීම්ශාලා හා පොත්ගුල් :— | | |
| (2) පඩි ... ... ... | 27 | 0 |
| එකතුව ... | 7,124 | 80 |

සත්‍ය පිටපතක් බවට සහතික කරමි.

පී. බී. විල්සන්,
විශේෂ කොමසාරිස්,
දෙවිනුවර නගරය.

1973 ඔක්තෝබර් මස 16 වැනි දින,
දෙවිනුවර විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–964/1—73.10.26 දින අංක 83 දරන ගැසට් පත්‍රය

---

## දෙවිනුවර නගරය

මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

**1973 අයවැය ලේඛනය (විදුලිය අංශය)**

1973 වර්ෂයේ විදුලි අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරිවේයැයි ගණන් බලන ලද පහත දැක්වෙන ශීර්ෂ යටතේවූ මුදල ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂවලට මාරුකර අවශ්‍ය වී තිබෙන වැය ප්‍රතිපාදනය කිරීමට 1973 ඔක්තෝබර් මස 16 වැනි දින අංක 414 දරණ තීරණයෙන් මම සම්මත කරමි.

| ඉතිරි මුදල් වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|
| (3) පාලනය හා සාමාන්‍ය වියදම් : | | |
| (ඊ) ගමන් වියදම් ගාස්තු ... ... | 200 | 0 |
| (එල්) නීතිඥ ගාස්තු ... ... ... | 150 | 0 |
| (4) විදුලි බලය බෙදා හැරීම : | | |
| (ඊ) කම්කරු වන්දි මුදල් ... ... | 250 | 0 |
| (ඇෆ්) විවිධ ගාස්තු ... ... ... | 100 | 0 |
| (5) නඩත්තුව සහ අළුත්වැඩියා කිරීම : | | |
| (ඒ) ගොඩනැගිලි ... ... ... | 400 | 0 |
| (6) පාරිභෝගිකයින් සඳහා ක්‍රියාවේ යෙදවූ කර්මාන්ත : | | |
| (ඒ) ද්‍රව්‍ය— | | |
| (1) නව සේවා පිරිද්දුම් සඳහා ... ... | 335 | 18 |
| (බී) කම්කරු ගාස්තු— | | |
| (1) තාවකාලික ... ... ... | 800 | 0 |
| එකතුව ... | 2,235 | 18 |

| අමතර මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | රු. | ශ |
|---|---|---|
| (3) පාලනය හා සාමාන්‍ය වියදම් : | | |
| (ඒ) වැටුප් හා වේතන ... ... ... | 185 | 0 |
| (එම්) විශ්‍රාම වැටුප්, පාරිතෝෂික මුදල් හා අර්ථසාධක අරමුදලට දායක මුදල් ... ... ... | 275 | 0 |
| (ජේ) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ ගාස්තු ,ප්‍රචාරක වියදම් සහ කාර්යාලීය සහ වෙනත් වියදම් ... ... ... | 400 | 0 |
| (4) විදුලි බලය බෙදා හැරීම : | | |
| (ඒ) වැටුප් සහ වේතන ... ... | 1,200 | 0 |
| (සී) අතිකාල දීමනා ... ... ... | 25 | 18 |
| (5) නඩත්තුව සඳහා අළුත්වැඩියා කිරීම : | | |
| (බී) මීටර් සහ අනිකුත් උපකරණ ... ... | 150 | 0 |
| | 2,235 | 18 |

සත්‍ය පිටපතක් බවට සහතික කරමි.

පී. බී. විල්සන්,
විශේෂ කොමසාරිස්,
දෙවිනුවර නගරය.

1973 ඔක්තෝබර් මස 16 වැනි දින,
දෙවිනුවර විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–964/2—73.10.26 දින අංක 83 දරන ගැසට් පත්‍රය

### අයවැය ලේඛණය

### කොළොන්නාව නගර සභාව

### 1973—2 වෙනි පරිපූරක අයවැය

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|---|
| ඒ.—(2) (බී) ආයකන—ගමන් වියදම් ... ... | 1,000 | 0 | අංක 12—1973.10.08 |
| ඒ.—(2) (ජේ) ආයතන—විවේක දුම්රිය ප්‍රවේශ පත්‍ර ... ... | 1,000 | 0 | එම |
| බී.—(8) මංමාවත්—සංවර්ධනය ... ... ... | 1,350 | 0 | අංක 14 (8)—1973.08.14 |
| බී.—(12) මංමාවත්—අභිනව වැඩ ... ... | 3,800 | 0 | අංක 8, 14 (11), 14 (12)—1973.08.14 |
| ඩී.—(5) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි ලී බඩු සහ උපකරණ ... | 2,874 | 0 | අංක 14 (17)—1973.10.08 |
| ඩී.—(7) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි—අභිනව වැඩ ... | 262 | 50 | අංක 9—1973.10.08 |
| ඊ.—(2) (බී) පවිත්‍ර සේවය—කරත්ත සහ ලොරිවලට ... ... | 16,000 | 0 | අංක 14 (6)—1973.10.08 |
| ඊ.—(2) (සී) පවිත්‍ර සේවය—ගබඩා ... ... | 2,000 | 0 | අංක 12—1973.10.08 |
| ඊ.—(3) (බී) වැසිකිළි ශෝධනය—කරත්ත සහ ලොරිවලට ... | 25,052 | 50 | අංක 14 (5)—1973.10.08 |
| ඊ.—(3) (ජී) වැසිකිළි ශෝධනය—ගොඩනැගිලි ... ... | 3,752 | 0 | අංක 14 (7)—1973.10.08 |
| ඊ.—(3) (අයි) වැසිකිළි ශෝධනය—මළනාලිකා යන්ත්‍රාගාර ... | | | අංක 12—1973.10.08 |
| නඩත්තුව ... ... ... | 8,000 | 0 | අංක 14 (10)—1973.08.14 |
| ඊ.—(5) (ජේ) ජල සම්පාදනය—මිළට ගැනීම ... ... | 1,05,000 | 0 | අංක 12—1973.10.08 |
| අයි.—(2) කිරුම් හා මිනුම්—ගබඩා ... ... ... | 25 | 0 | අංක 12—1973.10.08 |
| | 1,70,116 | 0 | |

විදුලිය—1 වෙනි කොටස

| | රු. | ශ. | |
|---|---|---|---|
| 3 (ජී) පාලනය සහ සාමාන්‍ය වියදම්—<br>නිදහස් දුම්රිය බලපත්‍ර ... ... ... | 1,000 | 0 | අංක 12—1973.10.08 |
| 3 (ජේ) පාලනය සහ සාමාන්‍ය වියදම්—<br>ලිපිද්‍රව්‍ය, මුද්‍රණ ගාස්තු හා කාර්යාලයීය වියදම් ... ... | 5,000 | 0 | අංක 12—1973.10.08 |
| | 6,000 | 0 | |

1973 අගෝස්තු මස 14 වෙනි දින රැස්වීමේ අංක 8, 14 (10), 14 (11), 14 (12) සහ 1973 ඔක්තෝබර් මස 08 වෙනි දින රැස්වීමේ අංක 9, 12, 14 (5), 14 (6), 14 (7), 14 (8), 14 (10) සහ 14 (17) දරණ සභා සම්මුති යටතේ සම්මත කරන ලදී.

ගලගෙදරගේ සෝමසිරි,
සභාපති,
කොළොන්නාව නගර සභාව.

1973 ඔක්තෝබර් මස 15 දින,
වැල්ලම්පිටිය, කොලොන්නාව,
නගර සභාවේ දීය.

10–1016—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### කුලියාපිටිය නහරයේ සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම (1973–76) විදුලි යෝජනා

ප්‍රාදේශීය සහකාර පළාත් පාලන කොට්ඨාශය : කුරුණෑගල.
මැතිවරණ කොට්ඨාශය : කුලියාපිටිය.
පළාත් ආණ්ඩු සභාව : විශේෂ කොමසාරිස් කාර්යාලය, කුලියාපිටිය නගරය.
පළාත් ආණ්ඩු සභාවේ ශ්‍රේණිය : 3 වන ශ්‍රේණියේ නගර සභාව.

| | 1973 රු. ශ. | 1974 රු. ශ. | 1975 රු. ශ. | 1976 රු. ශ. |
|---|---|---|---|---|
| 1. යන්ත්‍ර සහ උපකරණ සඳහා ආයෝජනයන්— | | | | |
| (ඒ) විදුලිය නිපදවීමේ යන්ත්‍ර ... ... | — | — | — | — |
| (බී) රථවාහන ... ... ... | — | — | — | — |
| (සී) ආයුධ ... ... | — | — | — | — |
| 2. උප මධ්‍යස්ථාන දියුණු කිරීම ... ... ... | 1,29,240 0 | — | — | — |
| 3. අළුත් උප මධ්‍යස්ථාන ... ... ... | — | — | — | — |
| 4. විදුලිය බෙදහැරීමේ මාර්ග දියුණු කිරීම ... ... | 5,000 0 | 8,000 0 | 10,000 0 | 10,000 0 |
| 5. විදුලිය බෙද හැරීමේ මාර්ග දීර්ඝ කිරීම ... ... | 20,000 0 | 75,000 0 | 80,000 0 | 1,00,000 0 |
| | | (1)2,00,000 0 | | |
| 6. ගොඩනැගිලි ... ... ... | — | 20,000 0 | — | — |
| | 1,54,240 0 | 3,03,000 0 | 90,000 0 | 1,45,000 0 |

(1) දේ. ණ. සං. අරමුදලින් ණයක් ලබා ගැනීමෙන්

ඉදිරි සිව්වස තුලදී ඇතිකිරීමට බලාපොරොත්තුවන තනතුරු—

විදුලි ෆෝර්මන් 1
විදුලිය කම්බිකරු 1
විදුලිය කම්කරු 4

1973 ඔක්තෝබර් 05 වෙනි දින තීරණ අංක 432 යටතේ තීරණය කරන ලදී.

කේ. බී. සත්කුමාර,
කුලියාපිටිය නගරයේ විශේෂ කොමසාරිස්.

1973.10.05 වෙනි දින,
කුලියාපිටිය විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–883—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

## සිව් අවුරුදු සංවර්ධන සැළැස්ම (1973–76)

ප්‍රාදේශීය සහකාර පළාත් පාලන කොට්ඨාශය : කුරුණෑගල.
මැතිවරණ කොට්ඨාශය : කුලියාපිටිය.
පළාත් ආණ්ඩු සභාව : විශේෂ කොමසාරිස් කාර්යාලය.
පළාත් ආණ්ඩු සභාවේ ශ්‍රෙණිය : 3 වන ශ්‍රෙණියේ නගර සභාව.

| අංකය | සංවර්ධන කටයුත්ත | (1) 1973 | | | 1974 | | | 1975 | | | 1976 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආධාර රු. ශ. | ණය රු. ශ. | පොදු අරමුදල රු. ශ. | ආධාර රු. ශ. | ණය රු. ශ. | පොදු අරමුදල රු. ශ. | ආධාර රු. ශ. | ණය | පොදු අරමුදල රු. ශ. | ආධාර රු. ශ. | ණය | පොදු අරමුදල රු. ශ. |
| 1. | ප්‍රධාන මාර්ග නඩත්තු කිරීම | — | — | 5,000 0 | — | — | 5,000 0 | — | — | 6,000 0 | — | — | 8,000 0 |
| 2. | තිස්ස මාවත් පැති කාණු බැඳීම | — | — | 3,000 0 | — | — | — | — | — | — | — | — | — |
| 3. | වතුර බැසයාමේ කාණු බැඳීම | — | — | — | — | — | 5,000 0 | — | — | 10,000 0 | — | — | 12,000 0 |
| 4. | දණ්ඩගමුව පොල්හේන වත්ත හරහා ඇති මාවත වැඩිදියුණු කිරීම | — | — | 2,000 0 | — | — | 5,000 0 | — | — | — | — | — | — |
| 5. | තානායම වැඩිදියුණු කිරීම | 25,000 0 | — | 12,000 0 | 20,000 0 | — | 50,00 0 | 10,000 0 | — | 2,000 0 | 10,000 0 | — | 2,000 0 |
| 6. | ජාතික කිරි මණ්ඩල වෙළඳ මධ්‍යස්ථානයක් තැනීම | — | — | 4,600 0 | — | — | — | — | — | — | — | — | — |
| 7. | ජාතික කිරි මණ්ඩල වෙළඳ මධ්‍යස්ථානයට ගෘහ භාණ්ඩ හා උපකරණ | — | — | 8,000 0 | — | — | — | — | — | — | — | — | — |
| 8. | නගර ශාලව වැඩිදියුණු කිරීම | — | — | 10,000 0 | — | — | 40,000 0 | — | — | 15,000 0 | — | — | — |
| 9. | ප්‍රසිද්ධ නාන ස්ථානයක් සකස් කිරීම | — | — | 3,350 0 | — | — | 4,000 0 | — | — | — | — | — | — |
| 10. | පොදු වෙළඳ පොල වැඩිදියුණු කිරීම | — | — | 2,000 0 | — | — | 8,000 0 | — | — | — | — | — | — |
| 11. | බණ්ඩාරනායක ක්‍රීඩාපිටිය පුලුල් කිරීම | — | — | 10,000 0 | — | — | 25,000 0 | — | — | 15,000 0 | — | — | — |
| 12. | කදුරුගස්හේන පාර ජලනල සේවය දීර්ඝ කිරීම | — | — | 3,700 0 | — | — | — | — | — | — | — | — | — |
| 13. | නගර සභා ඉඩම් හා ගොඩනැගිලි වැඩිදියුණු හා නඩත්තු කිරීම | — | — | 5,000 0 | — | — | 6,000 0 | — | — | 8,000 0 | — | — | 10,000 0 |
| 14. | මස් මඩුවේ කාප්ප බැඳීම | — | — | 2,000 0 | — | — | — | — | — | — | — | — | — |
| 15. | පුස්තකාලයට පොත්පත් හා උපකරණ සැපයීම | 3,000 0 | — | 2,000 0 | 3,000 0 | — | 2,000 0 | 3,000 0 | — | 2,000 0 | 3,000 0 | — | 2,000 0 |
| 16. | ප්‍රජාමණ්ඩල ක්‍රීඩා කටයුතු දියුණුකිරීම | — | — | 1,000 0 | — | — | 1,000 0 | — | — | 1,000 0 | — | — | 1,000 0 |
| 17. | සෞඛ්‍ය හා ජලසේවා සඳහා වාහනයක් මිළට ගැනීම | — | — | — | — | 40,000 0 | — | — | — | — | — | — | — |
| 18. | නිවාස යෝජනා ක්‍රමයක් සඳහා ඉඩම් ලබාගැනීම | — | — | — | — | — | 20,000 0 | — | — | — | — | — | — |
| 19. | නිවාස යෝජනා ක්‍රමයක් තැනීම | — | — | — | 40,000 0 | 40,000 0 | 10,000 0 | 40,000 0 | — | 12,000 0 | 25,000 0 | — | 10,000 0 |
| 20. | කදුරුගස්හේන ගමට යන පාර වැඩිදියුණු කිරීම | — | — | — | — | — | 1,000 0 | — | — | — | — | — | — |
| 21. | බාල්දි වැසිකිලි ජලමුද්‍රික බවට පරිවර්තනය කිරීම | — | — | — | 4,000 0 | — | — | — | — | 2,500 0 | — | — | 2,500 0 |
| 22. | ජනතා පොලක් පිහිටුවීම | — | — | 2,000 0 | — | — | 5,000 0 | — | — | 5,000 0 | — | — | — |
| 23. | වගා ව්‍යාපාරය නගාසිටුවීම | — | — | 2,000 0 | — | — | 3,000 0 | — | — | 3,000 0 | — | — | 3,000 0 |
| 24. | මාර්ග පුළුල් කිරීමට වන්දි ගෙවීම | — | — | — | — | — | 5,000 0 | — | — | — | — | — | — |
| 25. | ළමා ක්‍රීඩාපිටියක් තැනීම | — | — | — | — | — | — | — | — | 15,000 0 | — | — | 10,000 0 |
| 26. | අතුරුමාර්ග දීර්ඝකිරීම හා වැඩිදියුණු කිරීම | — | — | 5,000 0 | — | — | 8,000 0 | — | — | 10,000 0 | — | — | 20,000 0 |
| 27. | එළිමහන් රඟහලක් තැනීම | — | — | — | — | — | 5,000 0 | — | — | 5,000 0 | — | — | 20,000 0 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 28. නිවාස යෝජනා ක්‍රමය නඩත්තු කිරීම ... | — | — | — | — | — | 2,000 0 | — | — | 2,000 0 | — | — | 8,000 0 |
| 29. ජලනල සේවාවන් දීර්ඝ කිරීම වැඩිදියුණු කිරීම | — | — | — | — | — | 2,000 0 | — | — | 4,000 0 | — | — | 8,000 0 |
| 30. දුප්පත් ළමයින්ට නොමිළයේ පොත් බෙදීම ... | — | — | 2,000 0 | — | — | 3,000 0 | — | — | 3,500 0 | — | — | 4,000 0 |
| 31. ආයුර්වේද බෙහෙත්ශාලාව වැඩිදියුණු කිරීම හා උපකරණ සැපයීම | 15,000 0 | — | 5,000 0 | 15,000 0 | — | 5,000 0 | 15,000 0 | — | 6,000 0 | 15,000 0 | — | 5,000 0 |
| | 43,000 0 | — | 89,650 0 | 82,000 0 | 80,000 0 | 1,75,000 0 | 68,000 0 | — | 1,27,000 0 | 53,000 0 | — | 1,25,500 0 |

ඉදිරි සිව්වස තුලව ඇතිකිරීමට බලාපොරොත්තු වන තනතුරු—

| | | | |
|---|---|---|---|
| ලිපිකරුවන් | 4 | ගබඩා භාරකරුවන් | 1 |
| නගර ශාලා භාරකරුවන් | 1 | නගරශාලා මුරකරුවන් | 1 |
| පුස්තකාල සහායකයින් | 1 | මාර්ග කම්කරුවන් | 4 |
| කිරිහල භාරකරු | 1 | ප්‍රජාමණ්ඩල භාරකරු | 1 |

1973 ඔක්තෝබර් මස 5 වැනි දින තීරණ අංක 432 යටතේ තීරණය කරන ලදී.

කේ. බී. සත්කුමාර,
කුලියාපිටිය නගරයේ විශේෂ කොමසාරිස්.

1973.10.05 වෙනි දින,
කුලියාපිටිය,
විශේෂ කොමසාරිස් කාර්යාලයේදී ය.

10-883—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

මාතර නගරය

1973 වර්ෂයේ 6 වැනි පරිපූරක අය–වැය ලේඛනය

සාමාන්‍ය ගිණුම

| වැය ශීර්ෂ සහ උප ශීර්ෂය | රු. ශ. |
|---|---|
| අයි.—කිරුම් හා මිනුම් :— | |
| (2) බඩුබාහිරාදිය ගැන වියදම් ... ... ... | 32,305 0 |

ඉහත සඳහන් පරිපූරක අයවැය ලේඛනය 1973.10.05 දින මගේ අංක 329 දරණ තීරණයෙන් පිළිගන්නා ලදී.

ඒ. ඊ. බුල්ජන්ස්,
මාතර නගරයේ විශේෂ කොමසාරිස්.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
මාතර නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලය.

10–948/1—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

මාතර නගරය

1973 අය–වැය ලේඛනය

මුදල් රෙගුලාසි 12 (ii) යටතේ අයදුම් පත

පහත සඳහන් වැය ශීර්ෂය යටතේ වූ ඉතිරිවේය යි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයට මාරු කර අවශ්‍ය වී ඇති අතිරේක වැය සඳහා එම ශීර්ෂය යටතේ යෙදීමට 1973 ඔක්තෝබර් මස 10 වැනි දින මාතර නගරය පාලනය කිරීමට පත්කර ඇති විශේෂ කොමසාරිස් වන මා, මගේ තීරණ අංක 340 යටතේ සම්මත කරන ලදී.

විදුලිය ගිණුම

| ඉතිරිය | රු. ශ. | අධිකය | රු. ශ. |
|---|---|---|---|
| 4. විදුලිය බෙදා හැරීම— | | 3. පාලනය සහ සාමාන්‍ය වියදම— | |
| (ඇ/ජ්) විවිධ ගාස්තු ... ... | 250 0 | (එල්) නීතිඥ ගාස්තු ... ... ... | 250 0 |

ඒ. ඊ. බුල්ජන්ස්,
මාතර නගරයේ විශේෂ කොමසාරිස්.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
මාතර නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලය.

10–948/2—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

බෙන්තොට සුළු නගර සභාව

සුළු නගර සභා මුදල් නීති 40(ii) යටතේ අයදුම් පත්‍රය

1973 වර්ෂයේ අය–වැය ලේඛනය

1973 වර්ෂයේ අය–වැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලනලද මෙහි පහත සඳහන් මුදල්, වැඩිපුර මුදල් අවශ්‍යවේයයි ගණන් බලන ලද, ඊට අනුරූපව ඇති වැය ශීර්ෂයන්ට මාරු කර වියදම් කිරීමට 1973 අගෝස්තු මස 28 වැනි දින පැවති සභා රැස්වීමේදී අංක 2(8) දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

| මුදල් ඉතිරිවන වැය ශීර්ෂය | රු. ශ. | අතිරේක මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—(2) (ඩී) කක්සේරු ගාස්තු ... ... | 205 0 | ඒ.—(2) (ජේ) හදිසි වියදම් ... ... | 50 0 |
| | | බී 13 විවාහක දීමනා ... ... | 55 0 |
| | | ජී 1 සුනඛයින් විනාශ කිරීම ... ... | 100 0 |
| | 205 0 | | 205 0 |

විදුලිය අංශය

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| ඊඇල්.—(1) (ඒ) තොග වශයෙන් මිළදී ගැනීම—විදුලිය ගාස්තු | 1,000 0 | ඊඇල්.—(6) (ඒ) (1) පාරිභෝගිකයින් සඳහා ක්‍රියාවේ යෙදවූ කර්මාන්ත—ද්‍රව්‍ය—නව සේවා පිරිද්දුම් සඳහා ... | 4,500 0 |
| (3) (ඒ) වැටුප් හා වේතන ... ... | 2,500 0 | | |
| (4) (ඒ) වැටුප් හා වේතන ... ... | 1,000 0 | | |
| | 4,500 0 | | 4,500 0 |

චන්ද්‍රරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

1973 සැප්තැම්බර් මස 15 වැනි දින,
බෙන්තොට සුළු නගර සභා කාර්යාලය,

අනුමත කරන ලදී.

පර්සි අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, ගාල්ල.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
නගර ශාලාව, ගාල්ල.

10–952—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

## අගලවත්ත සුළු නගර සභාව

### අය–වැය ලේඛනය

### 1973 වර්ෂයේ පරිපූරක අය–වැය ලේඛනය

1 වැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(2) (බී) ගමන් ගාස්තු ... ... | 930 | 0 |
| ඒ.—(2) (එච්) ගණන් පරීක්ෂණ ගාස්තු ... ... | 800 | 0 |
| ඒ.—(2) (කේ) කාර්යාලයීය උපකරණ ... ... | 1,000 | 0 |
| බී.—(8) මහා මාර්ග ප්‍රතිසංස්කරණය ... ... | 1,900 | 0 |
| ඩී.—(2) (ඒ) කසල ශෝධන වැටුප් ... ... | 900 | 0 |
| ජේ.—(2) පුස්තකාලීය පොත් පත් ... ... | 500 | 0 |
| ජේ.—(4) පුස්තකාලීය උපකරණ ... ... | 750 | 0 |
| | 6,780 | 0 |

1973 ක්වූ ජූනි මස 30 වැනි දින පැවති සභා රැස්වීමේදී යෝජනා අංක 7 යටතේ ඒකමතිකව සභා සම්මත විය.

ඒ. බී. මර්වින් සමරනායක,
සභාපති,
අගලවත්ත සුළු නගර සභාව.

1973 ක්වූ ජූලි මස 09 වැනි දින,
අගලවත්ත සුළු නගර සභා කාර්යාලයේදීය.

සංශෝධනයකර අනුමත කරමි.

එල්. ජී. ටී. වික්‍රමසේකර,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කළුතර.

1973 ඔක්තෝබර් 16 වැනි දින,
කළුතර පා.පා.ස.කො. කාර්යාලයේදිය.

10–967—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

## යටියන්තොට නගරය

### 1973 වර්ෂයේ II වැනි පරිපූරක වැය ලේඛනය

1 වැනි කොටස—සාමාන්‍ය අංශය

| වැය ශීර්ෂය | මුදල |
|---|---|
| සී. සභා ගොඩනැගිලි සහ ඉඩම් | |
| 7. අලුත් වැඩ | 2,500.00 |

යටියන්තොට නගරය පාලනය කිරීමට පත් කර ඇති විශේෂ කොමසාරිස් වන මා විසින්, කෑගල්ලේ පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ සංශෝධනයට යටත්ව 1973.10.06 වන දින තීරණය කරන ලදී.

නීල් ඩයස්,
විශේෂ කොමසාරිස් - යටියන් තොට නගරය.

1973. 10. 08 වෙනි දින,
යටියන් තොට නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

අනුමත කරමි.

පැරකුම් විජේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස් - කෑගල්ල.

1973. 10. 16 දින,
කෑගල්ලේ,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දීය.

10–970—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

## අලව්ව සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 40(ii) යටතේ කෙරෙන අයදුමයි

### 1973 අය–වැය ලේඛනය

1 වන කොටස—සාමාන්‍ය අංශය

1973 අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරි වේයයි ගණන් බලන ලද මුදල්, පහත දක්වෙන ශීර්ෂවලට මාරුකර අවශ්‍ය වී තිබෙන වැය සඳහා එම ශීර්ෂය යටතේ යෙදවීමට 1973 අගෝස්තු මස 31 වැනි දින රැස්වීමේ අංක 7 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

| ඉතිරිවේයැයි ගණන් බලන ලද ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය :— | | |
| (1) (බී) කා.කා.ස., මුරකරු සහ කම්කරු ... | 750 | 0 |
| (2) (බී) ගමන් ගාස්තු ... ... ... | 1,000 | 0 |
| බී.—මංමාවත් :— | | |
| (14) බස් නවතන ස්ථාන හා බස් නැවතුම්පළවල් ... | 500 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍ය :— | | |
| (3) (සී) උපකරණ ... ... ... | 300 | 0 |
| (ඊ) වැසිකිලි නඩත්තුව ... ... | 300 | 0 |
| (ජී) ඉදි කිරීම් ... ... ... | 2,117 | 0 |
| එකතුව ... | 4,967 | 0 |

| අවශ්‍ය වී ඇති වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය :— | | |
| (1) (සී) ආදායම් පරීක්ෂකයන් ... ... | 2 | 0 |
| (ඇ(ජ්) විශ්‍රාම වැටුප් ... ... | 120 | 0 |
| (2) (ඒ) අතිරේක දීමනා ... | 125 | 0 |
| බී.—මංමාවත් :— | | |
| (4) වීථි ආලෝක කිරීම ... | 1,000 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍ය :— ... | | |
| (1) (ඒ) සෞඛ්‍ය පරීක්ෂකයින් ... ... | 2,160 | 0 |
| (2) (ඒ) දෛනික වැටුප් ... ... | 750 | 0 |
| (3) (ඒ) දෛනික වැටුප් ... ... | 750 | 0 |
| ඊ.—මහජන විනෝදය :— | | |
| (7) විනෝද බදු පරීක්ෂාව ... | 60 | 0 |
| එකතුව ... | 4,967 | 0 |

II වන කොටස—විදුලිය දෙපාර්තමේන්තුව

| ඉතිරිවේයැයි ගණන් බලන ලද ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ව්.—(1) (ඒ) විදුලිය ගාස්තු ... ... | 2,525 | 0 |
| එකතුව .... | 2,525 | 0 |

| අවශ්‍ය වී ඇති වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| (3) පාලනය හා සාමාන්‍ය වියදම් : | | |
| (ඊ) ගමන් ගාස්තු ... ... | 50 | 0 |
| (ජී) නිදහස් දුම්රිය බලපත්‍ර ... | 100 | 0 |
| (ජේ) ලිපි ද්‍රව්‍ය ... ... ... | 350 | 0 |
| (කේ) බැංකු ගාස්තු ... ... ... | 25 | 0 |
| (6) පාරිභෝගිකයන් සඳහා කරන කර්මාන්ත : | | |
| (ඒ) (1) නව සේවා පිරිදුම් ගාස්තු ... | 2,000 | 0 |
| එකතුව ... | 2,525 | 0 |

1973 සැප්තැම්බර් මස 19 වැනි දින,
අලව්ව සුළු නගර සභා කාර්යාලයේ දීය.

එච්. ඇම්. කුමාරදාස,
අලව්ව සුළු නගර සභාවේ සභාපති.

අනුමත කරමි.

එච්. ඇම්. හේරත් බණ්ඩා,
පළාත් පාලන සහකාර කොමසාරිස්, කුරුණෑගල.

1973 ඔක්තෝබර් මස 13 වැනි දින,
කුරුණෑගල දීය.

10–954—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

## රුවන්වැල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40(ii) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

### 1973 අය–වැය ලේඛනය

### 1 වැනි කොටස (සාමාන්‍ය)

1973 වර්ෂයේ අයවැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත සඳහන් වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට, 1973ක්වූ සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද රුවන්වැල්ල සුළු නගර සභාවේ මාසික රැස්වීමේ අංක 5(ඉ) දරණ යෝජනාවෙන්, කැගල්ලේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමතියට යටත්ව සභා සම්මත විය.

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | මුදල රු. | ශ. |
|---|---|---|
| ඒ.—පොදු වියදම් :— | | |
| (5) පාසැල් පොත් ... ... ... | 225 | 48 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (5) ජල සම්පාදනය : | | |
| (ඇෆ්) ණය ගාස්තු ... ... ... | 23,750 | 0 |
| එකතුව ... | 23,975 | 48 |

| මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | මුදල රු. | ශ. |
|---|---|---|
| ඒ.—පොදු වියදම් :— | | |
| (1) (ඇෆ්) විශ්‍රාම වැටුප් ... ... | 400 | 0 |
| (1) (ජී) ජීවනාධාර/විශේෂ ජීවනාධාර ... | 453 | 56 |
| (2) (බී) ගමන් ගාස්තු ... ... ... | 1,500 | 0 |
| (2) (ඊ) නීති වියදම් ... ... ... | 400 | 0 |
| (2) (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ, දැන්වීම් හා කාර්යාලීය වියදම් | 1,000 | 0 |
| (2) (ඇම්) අතිකාල දීමනා ... ... | 500 | 0 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :— | | |
| (1) වේතන ... ... ... | 697 | 44 |
| (6) ණය ගාස්තු ... ... ... | 2,516 | 32 |
| (7) අළුත් වැඩ ... ... ... | 10,000 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) (එච්) කාණු සෑදීම ... ... ... | 2,000 | 0 |
| (4) (ඩී) සෑදීම ... ... ... | 2,500 | 0 |
| (5) (ඩී) අත්පත් කරගැනීම ... ... | 228 | 16 |
| (7) (ඒ) වේතන ... ... ... | 675 | 0 |
| ඊ.—මහජන සාදයෝ :— | | |
| (4) ඉඩම් අත්පත් කරගැනීම ... | 205 | 0 |
| ජී.—සුනඛයින් ලියාපදිංචි කිරීම :— | | |
| (1) බල්ලන් විනාශ කිරීම ... ... | 400 | 0 |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල :— | | |
| (3) පොත්පත් හා සඟරා ... ... | 500 | 0 |
| එකතුව ... | 23,975 | 48 |

### දෙවැනි කොටස—විදුලිය අංශය

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | මුදල රු. | ශ. |
|---|---|---|
| (3) පාලනය හා සාමාන්‍ය වියදම් : | | |
| (අයි) ලබන සේවා වෙනුවෙන් සාමාන්‍ය අංශයට දෙන මුදල | 9,250 | 0 |
| (කේ) බැංකු ගාස්තු ... ... ... | 100 | 0 |
| (ඕ) රක්ෂණ ගාස්තු ... ... ... | 136 | 94 |
| (4) විදුලි බලය බෙදා හැරීම : | | |
| (ඇෆ්) විවිධ ගාස්තු ... ... ... | 800 | 6 |
| (6) පාරිභෝගිකයන් සඳහා ක්‍රියාවේ යෙදවූ කර්මාන්ත : | | |
| (ඒ) නඩත්තු කිරීම ... ... | 300 | 0 |
| එකතුව ... | 10,587 | 0 |

| මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | මුදල රු. | ශ. |
|---|---|---|
| (3) පාලනය හා සාමාන්‍ය වියදම් : | | |
| (ඒ) වැටුප් හා වේතන ... ... ... | 6,500 | 0 |
| (බී) විවාහක දීමනා ... ... ... | 625 | 0 |
| (එච්) විශ්‍රාම වැටුප් ... ... ... | 75 | 0 |
| (ජේ) ලිපි ද්‍රව්‍ය ... ... ... | 250 | 0 |
| (4) විදුලි බලය බෙදා හැරීම : | | |
| (සී) අතිකාල දීමනා ... ... ... | 800 | 0 |
| (5) නඩත්තුව හා අළුත් වැඩියා කිරීම් : | | |
| (බී) මීටර් හා අනිකුත් උපකරණ ... ... | 337 | 0 |
| (6) පාරිභෝගිකයන් සඳහා ක්‍රියාවේ යෙදවූ කර්මාන්ත : | | |
| (ඒ) (1) නව සේවා පිරිද්දුම් සඳහා ... ... | 2,000 | |
| එකතුව ... | 10,587 | 0. |

ඩී. ඇම්. හේමපාල දසනායක,
රුවන්වැල්ල සුළු නගර සභාවේ සභාපති

1973 ඔක්තෝබර් මස 8 වැනි දින,
රුවන්වැල්ලේ සුළු නගර සභා කාර්යාලයේ දීය.

අනුමත කරමි.

පැරකුම් විජේසිංහ,
කැගල්ලේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1973 ඔක්තෝබර් මස 16 වැනි දින
කැගල්ලේ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දීය.

10–967—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

## වේයන්ගොඩ සුළු නගර සභාව

### 1973 තුන් වැනි පරිපූරක අය වැය ලේඛණය

### II වන කොටස—විදුලිය

| | රු. ශ. |
|---|---|
| ඊ ඇල්. 5 (බි) මීටර් සහ අනිකුත් උපකරණ ... | 1,000 00 |
| ඊ ඇල්. 6ඒ (1) නව සේවා පිරිවැද්දුම් සඳහා ... | 3,000 00 |
| ... | 4,000 00 |

වර්ෂ 1973 ක්වූ සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද වේයන්ගොඩ සුළු නගර සභාවේ මාසික සාමාන්‍ය සභා රැස්වීමේ යෝජනා අංක 17 අනුව සභා සම්මත විය.

ඒ. කේ. ආර්. පෙරේරා,
සභාපති,
වේයන්ගොඩ සුළු නගර සභාව.

1973 ඔක්තෝබර් මස 10 වැනි දින,
වේයන්ගොඩ සුළු නගර සභා කාර්යාලයේ දී ය.

10—776—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

### මතුගම සුලු නගර සභාව

### සුලු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ අයදුම් පත්‍රය

1973 වර්ෂයේ වැය සම්මතයන්ගෙන් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත සඳහන් මුදල් අනාය වැය සම්මතයන්හි අනුරූප අතිරේක වැය පියවා ගැනීම සඳහා පහත දක්වා ඇති පරිදි යෙදවීමට 1973.06.29 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේදී යෝජනා අංක 6 (II) යටතේද 1973.07.07 වැනි දින පවත්වන ලද විශේෂ සභා රැස්වීමේදී යෝජනා අංක 1 (II) (III) දරණ යෝජනා යටතේ සම්මත කරන ලදී.

සාමාන්‍ය අංශය

| මුදල් අවශ්‍ය වැය සිරස් | රු. | ශ. | මුදල් ඉතිරි වැය සිරස් | රු. | ශ. |
|---|---|---|---|---|---|
| බී.—(12) අළුත් වැඩ ... ... | 1,500 | 0 | ඒ.—(2) (ඊ) නීතියේ කටයුතු ... ... | 500 | 0 |
| ඩී.—(1) (එච්) කාණු ඉදිකිරීම ... ... | 1,069 | 0 | ඒ.—(2) (අයි) නිවාඩු දුම්රිය බලපත්‍ර ... ... | 500 | 0 |
| ඩී.—(2) (බී) කරත්ත ගොනුන් හා ලොරි ... | 1,100 | 0 | ඒ.—(2) (එච්) ගණකාධිකාරි ගාස්තු ... ... | 500 | 0 |
| ඩී.—(3) (බී) කරත්ත ගොනුන් හා ලොරි ... | 795 | 0 | ඩී.—(1) (එන්) මාතෘ දරකාභිවෘද්ධි මධ්‍යස්ථාන ... | 569 | 0 |
| | | | ඩී.—(1) (කේ) කිරි වර්ග කිරීම ... ... | 500 | 0 |
| | | | ඩී.—(2) (ඒ) වේතන ... ... ... | 795 | 0 |
| | | | ඩී.—(3) (ඊ) වැසිකිලි නඩත්තුව ... ... | 200 | 0 |
| | | | ඩී.—(5) (බී) උපකරණ ... ... | 900 | 0 |
| | 4,464 | 0 | | 4,464 | 0 |

එස්. පැස්කුවල්,
සභාපති.

1973 ක්වූ අගෝස්තු මස 8 වැනි දින,
මතුගම සුලු නගර සභා කාර්යාලයේදී ය.

අනුමත කරමි.

ලී. ජෝ. වික්‍රමසේකර,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කළුතර.

10–777—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

## දේපල විකිණීම්

### දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව

### ගිහ වරිපනම් ගාස්තු නොගෙවීම් නිසා දේපළ විකිණීමයි

1953 වර්ෂයේ සිට 1971 වර්ෂයේ අවසානය දක්වා මීට යාව ඇති උප ලේඛනයේ සඳහන් දේපල සම්බන්ධයෙන් ලැබිය යුතු ගිහ වරිපනම් බදු අයකර ගැනීමට, තහනම් කිරීම සඳහා චංචල දේපල නොමැති වූ කල්හි මහ නගර සභා අඥ පණතේ (252 අධිකාරය) 252 ඡෙදය ප්‍රකාර, මා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) කුලී සහ ලාභ, (2) දූව සහ උපදින ද්‍රව්‍ය, (3) ගෙයි උපකරණ සහ (4) පහත සඳහන් දේපලම, ඒ දේපල වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු සහ වරෙන්තු ගාස්තු යථා කාලයේ දී ගෙවනු නොලැබුවහොත්, එකී උප ලේඛණයේ සඳහන් දිනයන්හි පෙරවරු 8.00 සිට ආරම්භ කොට එකී දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඒ. එච්. ඒ. සැමී,
නාගරික කොමසාරිස්,
දෙහිවල-ගල්කිස්ස.

මහ නගර සභා කාර්යාලය,
දෙහිවල, 1973 ඔක්තෝබර් 16.

උප ලේඛණය

කොට්ඨාශ අංක 11

**1973 නොවැම්බර් 20 වැනි අඟහරුවාද**

ගල්කිස්ස පාර :—19/2, 39ඒ, 47, 47ඒ, 61, 63ඒ, 67/2, 67ඒ, 73, 73/1, 73ඒ, 73බී, 73ඩී, 77, 77බී, 77සී, 77ඩී, 77/1,ඒ 77/2.

**1973 නොවැම්බර් 21 වැනි බදාද**

ගල්කිස්ස පාර :—83බී, 85ඒ, 87, 87/1,91, 93, 95/5, 95/7, 95/10ඒ 95/11, 95/15, 95/16, 97, 107, 107/2.

සර් ඩී. බී. ජයතිලක මාවත :—20/1, 24/1, 50, 52, 62/3, 62/5, 62/6, 66, 66/5.

**1973 නොවැම්බර් 22 වැනි බ්‍රහස්පතින්ද**

සර් ඩී. බී. ජයතිලක මාවත :—66/8, 66/9, 66/10, 66/11, 70, 70/1, 70/2, 70/4, 74,76/1, 94, 136, 140/1, 146/1, 146/2, 146/3, 146/4, 146/7, 146/8, 146/10, 152, 154, 154/1, 154/2, 154/3.

**1973 නොවැම්බර් 23 වැනි සිකුරාද**

සර් ඩී. බී. ජයතිලක මාවත :—154/8, 154/9, 154/12, 154/15, 154/18, 154/21, 154ඒ, 154බී, 156, 156/1, 156/3, 162/2, 162/3ඒ, 162/4, 162/6ඒ, 162/10, 162/14, 182, 196/1, 196/3, 204, 208,216, 222, 232, 236, 244.

**1973 නොවැම්බර් 26 වැනි සඳුද**

සර් ඩී. බී. ජයතිලක මාවත :—246, 248, 250, 250/1, 250/5, 250/6, 250/9, 250/10, 250/16, 176/2, 174/2ඒ.

ජයතිලක මාවත :—3, 9, 19, 6.

**1973 නොවැම්බර් 27 වැනි අඟහරුවාද**

කව්ඩාන පාර :—3ඒ, 7, 7/1, 23/1, 23/4, 23/5, 23/6, 23/7, 25ඒ, 25බී, 25සී, 29/2, 29/3, 29/4, 29/5,29/6, 29/7, 29/11.

**1973 නොවැම්බර් 28 වැනි බදාද**

කව්ඩාන පාර:—29/13, 29/14, 31/3ඒ, 31/5, 31/6, 37/1, 39, 39/6, 39/7ඒ, 39/8, 39/9, 39/10, 43, 45, 47/1, 47/2, 47/3,49, 49/1ඒ, 49/2, 49/3, 57, 57/1, 59.

**1973 නොවැම්බර් 29 වැනි බ්‍රහස්පතින්ද**

පල්ලිදෙර පාර :—1, 3, 7, 11/1, 11/2, 11/3, 11/3ඒ, 11/4, 11/10, 11/11, 17/1, 21/2, 21/5, 21/6, 21/7, 21/8 21/10, 21/11, 21/11ඒ, 21/12, 21/13, 21/14, 21/16, 21/18, 21/26, 21/28, 29, 29ඒ, 29/4, 29/5, 29/6.

**1973 නොවැම්බර් 30 වැනි සිකුරාද**

පල්ලියදෙර පාර :—43, 43/1, 43ඒ, 43බී, 45, 45ඒ, 45බී, 45/1, 45/1ඒ, 49/1, 57/1, 59, 63/1, 63/1ඒ, 63/2, 63/3, 67/2, 73/1, 73/1ඒ, 73/1බී, 73/2,91, 91/1, 91/2, 93, 95, 95/1, 97, 99, 101/4, 101/5.

**1973 දෙසැම්බර් 3 වැනි සඳුද**

සිරිවර්ධන පාර :—29, 29/2, 29/3, 29/8, 29/8බී, 29/9, 29/10, 29/11, 29/12, 33/1, 33/7ඒ, 45, 2, 8/7 10, 14, 22, 24, 26, 28/4, 28/9, 28/10 28/11, 28/12, 28/14, 28/15, 30, 32/1, 38.

**1973 දෙසැම්බර් 4 වැනි අඟහරුවාද**

ශ්‍රී ධර්මාරාම පාර :—17/2, 17/3, 17/4, 17/4ඒ, 19, 19ඒ, 21/1, 17/5, 23, 27, 14/1, 22, 26, 32, 36, 36/1, 38, 40, 42, 44, 46, 48, 52.

**1973 දෙසැම්බර් 5 වැනි බදාද**

සුබෝධාරාම පාර :—5/1, 15/1, 15/1ඒ, 15/2, 15/3, 25/5ඒ, 25/14බී, 25/15, 25/21, 33, 35/6, 35/7, 4, 6/1, 6/3, 20, 20ඒ, 20/1, 20/2, 22/1, 22/2, 22/3.

**1973 දෙසැම්බර් 6 වැනි බ්‍රහස්පතින්ද**

යුනියන් පෙදෙස:—1, 9, 9/1, 9/1ඒ, 9/2, 9/3, 9/4, 25, 6, 6/1,6/2, 18/2, 18/2ඒ, 24/3, 30.

විජේසේකර පාර :—11, 11ඒ, 11/1, 11/2, 11/3, 11/4, 16, 18, 20, 24/2, 24/2ඒ, 24/3.

යෝගා පෙදෙස :—12/1, 14/1.

10–1022—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## මහනුවර නාගරිකය

1974 වර්ෂයට ගෙවිය යුතු වාහන හා සත්ව බදු

මහනුවර නගරයේ විශේෂ කොමසාරිස්, මුතුබණ්ඩාර සමරකෝන් වන මා 252 වැනි අධිකාරය වන මහනගර සභා ආඥා පනතේ 245 වැනි වගන්තියේ ප්‍රකාර මෙහි දැක්වෙන උපලේඛණයේ සඳහන් වාහන හා සත්ව බදු 1974 වර්ෂයට බලපාන ලෙස පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇම්. බී. සමරකෝන්,
විශේෂ කොමසාරිස්, මහනුවර නගරය.

1973 ඔක්තෝබර් මස 4 වැනි දින,
මහනුවර නගරයේ
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර් එකක්, රෝද තුනේ මෝටර් කාර් එකක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හැර අන් හැම වාහනයක් සඳහා ... ... | 10 | 0 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක්, බයිසිකල් කාර් එකක්, හෝ කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් එකක් හෝ කරත්තයක් සඳහා (වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම්) ... | 5 | 0 |
| සෑම බයිසිකලයක් හෝ බයිසිකල් කාර් එකක් හෝ කරත්තයක් හෝ ට්‍රයිසිකලයක් හෝ කරත්තයක් සඳහා (වෙළඳ කටයුතු හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම්) ... ... | 1 | 50 |
| සෑම බර කරත්තයක් සඳහා ... ... | 8 | 0 |
| සෑම බර බාගයක් සඳහා ... ... | 8 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 8 | 0 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 5 | 0 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා ... ... ... | 10 | 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... | 2 | 0 |

1 –956/1—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

## මහනුවර නාගරිකය

1974 වර්ෂයට බල්ලන් වෙනුවෙන් ගෙවිය යුතු බදු

**(477 වැනි අධිකාරය වන) බල්ලන් ලියා පදිංචි කිරීමේ ආඥාපනත**

මහනුවර නගරයේ විශේෂ කොමසාරිස්, මුතුබණ්ඩාර සමරකෝන් වන මා, (477 වැනි අධිකාරය වන) බල්ලන් ලියා පදිංචි කිරීමේ ආඥා පනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර මහනුවර නාගරික සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලකු හෝ බැල්ලියක වෙනුවෙන් 1974 වර්ෂයට රුපියල් 3 ක ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇම්. බී. සමරකෝන්,
විශේෂ කොමසාරිස්, මහනුවර නගරය.

1973 ඔක්තෝබර් මස 4 වැනි දින,
මහනුවර නගරයේ
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

10–956/2—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

## මාතලේ නාගරිකය

මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 159 වෙනි වගන්තිය යටතේ කෙරෙන දැන්වීමයි

මහ නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 159 හා 277(2)(ඒ) යන වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව, මාතලේ නගරයේ විශේෂ කොමසාරිස්, විලියම් අර්ල් ද අල්විස් වන මා, මෙම නිවේදනය රජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට, පහත දැක්වෙන ප්‍රසිද්ධ වීථිවල, කිසිම ද්‍රව්‍යයක් විකිණීම හෝ විකිණීම සඳහා තැබීම තහනම් කරන බව මෙයින් දන්වමි.

1. කුමාර විදිය
2. කන්දසාමි මාවත
3. බර්නාඩ් අලුවිහාරේ මාවත—කුමාර වීදිය හන්දියේ සිට මිෂන් මාවත (කලින් රෝස වීදිය) හන්දිය දක්වා
4. මිෂන් මාවත (කලින් රෝස වීදිය) සහ
5. දුම්රියපල පාර.

මෙම තහනම කඩ කරන ඕනෑම කෙනෙකු රුපියල් විස්සක දඩය කට යටත් වනු ඇත.

අර්ල් ද අල්විස්,
විශේෂ කොමසාරිස්,
මාතලේ නගරය.

විශේෂ කොමසාරිස් කායාීලය,
මාතලේ නගරය, මාතලේ,
1973 සැප්තැම්බර් මස 20 දින.

10–823—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

## බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලය

1974 වර්ෂයට සුනඛයින් පිළිබඳ බද්ද

**(477 වන අධිකාරය) බල්ලන් ලියා පදිංචි කිරීමේ ආඥාපනත**

(477 අධිකාරිය වන) සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර බණ්ඩාරවෙල නගර සීමාව තුළ තබාගන්නා සෑම බල්ලෙකුටම රු. 1.00ක් සහ සෑම බැල්ලියකටම රු. 1.50 ක් බැගින් 1974 වර්ෂයට ලියා පදිංචි කිරීමේ ගාස්තු වශයෙන් පනවා ඇති බවත් එකී ගාස්තු 1974 මාර්තු මස 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. ශා. ඇස් .පෙරේරා,
විශේෂ කොමසාරිස්,
බණ්ඩාරවෙල නගරය.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
බණ්ඩාරවෙල,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දිය.

10–1020/1—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

## බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලය

1974 වර්ෂයට රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද

**(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනත**

බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලය විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) (255 වන අධිකාරය) වන නගර සභා ආඥාපනතේ අංක 162 දරණ වගන්තිය යටතේ, 1973 වර්ෂයේ බල පැවැත්වූ ගාස්තුවලට සමාන බද්දක්, පහත උප ලේඛණයේ විස්තර වන ගණන් අනුව 1974 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අයකිරීමටද,

(2) එකී ආඥාපනතේ 163 (3) වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනිදට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින්ද වන බැව් වේ.

ආර්. ශා. ඇස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්,
බණ්ඩාරවෙල නගරය.

විශේෂ කොමසාරිස් කාර්යාලය,
බණ්ඩාරවෙල,
1973 ඔක්තෝබර් මස 15 වැනි දින.

### උපලේඛණය

| | රු. | ශත |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝ, කරත්ත, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයක් සඳහා ... .... | 2 | 0 |
| බයිසිකලයක්, රෝද තුනේ බයිසිකලයක්, බයිසිකල් මෝටර් රථයක් හෝ කරත්තයක් සඳහා— ... | | |
| (අ) වෙළඳාම සඳහා යොදනු ලැබේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් දෙයකට යොදනු ලැබේ නම් ... ... | 1 | 0 |
| කරත්තයක් (සාමාන්‍ය) ... | 1 | 0 |
| අත් කරත්තයක් ... | 0 | 50 |
| ජින් රික්ෂෝ රථයක් ... | 1 | 0 |
| අශ්වයෙක්, පෝනියෙක්, කොටළුවෙක් ... | 1 | 0 |
| ගොනෙක් හෝ බූරුවෙක් ... | 1 | 0 |

10–1020/2—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### වලස්මුල්ල සුළු නගර සභාව

1974 වර්ෂයට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)**

(477 වැනි අධිකාරය වන) සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තිය යටතේ, වලස්මුල්ල සුළු නගර සභා සීමාව තුළ ඇතිකර සිටින සෑම බල්ලෙක් හෝ බැල්ලියක් සඳහා රු. 1.00 ක් ලියා පදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1974 වර්ෂයට පනවා ඇති බවත්, එකී ගාස්තු 1974 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. එච්. ජේ. විජේසූරිය,
සභාපති,
සුළු නගර සභාව, වලස්මුල්ල.

1973 ඔක්තෝබර් මස 08 වැනි දින,
වලස්මුල්ල සුළු නගර සභා කාර්යාලයේදීය.

10–799/1—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### වලස්මුල්ල සුළු නගර සභාව

1974 වර්ෂය සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

**256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත**

වලස්මුල්ල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරන වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1974 වර්ෂයට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ 162(3) වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකිවිය අයුරින් ද වේ.

#### උපලේඛනය

සෑම බයිසිකලයකටම හෝ රෝද තුනේ බයිසිකලයකට හෝ බයිසිකල් කාරයකට හෝ කරත්තයකට හෝ රෝද තුනේ බයිසිකල් කාරයකට හෝ කරත්තයකට :—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) වෙළඳ කාර්යයක් සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 2 | 0 |
| (ආ) වෙළඳ කාර්යයක් හැර වෙන ඕනෑම කාර්යයක් සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 1 | 0 |
| (ඇ) ගොන් දෙන්නා බඳින සෑම කරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් ... ... | 3 | 0 |
| (ඈ) තනි ගොනා බඳින සෑම බරබාගයක් වෙනුවෙන් ... | 2 | 0 |
| (ඉ) සෑම තිරික්කලයක් වෙනුවෙන් ... ... | 1 | 0 |
| (ඊ) සෑම අත්කරත්තයක් වෙනුවෙන් ... ... | 1 | 0 |
| (උ) සෑම අශ්වයෙක්, අශ්ව පෝනියෙක් හෝ අශ්වතරයෙක් වෙනුවෙන් ... ... | 5 | 0 |
| (ඌ) සෑම බූරුවෙක් වෙනුවෙන් ... ... | 1 | 0 |

ඩී. එච්. ජේ. විජේසූරිය,
වලස්මුල්ල සුළු නගර සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 08 වැනි දින,
වලස්මුල්ල සුළු නගර සභා කාර්යාලයේ දීය.

10–799/2—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### දෙව්නුවර නගරය

සුළු නගර සභා ආඥාපනත

**1974 වර්ෂයට දේපල බද්ද**

(256 අධිකාරිය වන) සුළු නගර සභා ආඥාපනතේ මෙම ගත වී යන වර්ෂයට බල පවත්වන පහත සඳහන් වරිපනම් බදු දෙව්නුවර නගර සභා ප්‍රදේශය තුළ 1974 වර්ෂයටද එලෙසම පැනවීමට දෙව්නුවර විශෙෂ කොමසාරිස්වරයා තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපල වලට වාර්ෂික වටිනාකම් වලින් සියයට හයක් (6%) බැගින් වූ වාර්ෂික බද්ද පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු හතරකට ගෙවිය හැකි අයුරිනි.

පී. බී. විල්සන්,
විශේෂ කොමසාරිස්,
දෙව්නුවර නගරය.

1973 ඔක්තෝබර් මස 15 දින,
දෙව්නුවර විශෙෂ කොමසාරිස් කාර්යාලයේදීය.

10–966/1—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### දෙව්නුවර නගරය

රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද—1974

සුළු නගර සභා ආඥාපනතේ (256 වන පරිච්ඡේදයෙහි) 161 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ නම් කරන ලද රථ වාහන වලට හා සතුන්ට ඒ උපලේඛනයේ එම වාහන හා සතුන් ඉදිරියෙහි පහත සඳහන් කර තිබෙන ගාස්තු 1973 වර්ෂයට පනවා ඇති බවත් යථෝක්ත ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දනුම් දෙනු ලැබේ.

පී. බී. විල්සන්,
විශේෂ කොමසාරිස්,
දෙව්නුවර නගරය.

1973 ඔක්තෝබර් මස 15 දින,
දෙව්නුවර විශෙෂ කොමසාරිස් කාර්යාලයේදීය.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයෙ මෝටර් කාර්, මෝටර් පාපැදි, කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හැර වෙන ඕනෑම වාහනයක් සඳහ ... ... | 5 | 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයෙ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නැතහොත් මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාම හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 | 0 |
| තනි ගොනා බැඳි සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 3 | 0 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 4 | 0 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයකු, සෑම අශ්ව පෝනයකු, සෑම කොටළුවකු සඳහා ... ... ...... ... | 5 | 0 |
| සෑම ගොනෙකු හෝ බූරුවෙකු සඳහා ... ... | 1 | 0 |

10–966/2—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

### දෙව්නුවර නගරය

1974 වර්ෂය සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (334 වැනි පරිච්ඡේදය)**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 334 වැනි පරිච්ඡේදයේ 4 වැනි කොටසේ ප්‍රකාර දෙව්නුවර නගරය තුල තබාගන්නා සෑම බල්ලෙකුට රුපියල් එකක් (රු. 1) බැගින් ද, සෑම බැල්ලියකට රුපියල් එකයි ශත පණහක් (රු. 1.50) බැගින් ද, 1974 වර්ෂයට අය කිරීමට පනවා ඇති බවද එකී ගාස්තු 1974 මාර්තු 31 වැනිදාට හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බවද මෙයින් දනුම් දෙනු ලැබේ.

පී. බී. විල්සන්,
විශේෂ කොමසාරිස්,
දෙව්නුවර නගරය.

1973 ඔක්තෝබර් මස 15 දින,
දෙව්නුවර විශෙෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–966/3—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්යාලය—ධර්ගා නගරය

ධර්ගා නගරයේ පාලන සීමාව තුල ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම පාලන සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩ නැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ස්ථානයක හෝ පාරක හමුවන දඬාවතේ යන නැතහොත්, බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරණු ලබන අයෙකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (476 වන අධිකාරය) ජලභීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි. ගැසට් පත්‍රයේ පලවූ දින සිට හයමසක් ගත්වූ පසු මෙම නිවේදනය අවලංගු වන්නේ ය.

අයි. එල්. එම්. මන්සූර්,
විශේෂ කොමසාරිස්-ධර්ගා නගරය.

1973 ඔක්තෝබර් මස 16 දින,
ධර්ගා නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–1018—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### කොලොන්නාව නගර සභාව

පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1972. 01. 07 දාතමින් (261 වන අධිකාරිය වන) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වෙනි හා 4 වෙනි වගන්ති ප්‍රකාර 1972 මාර්තු මස 10 වෙනි දින හා අංක 15,001 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ iv වැනි කොටසේ නගර සභා වෙනුවෙන් ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලවන දින සිට කොලොන්නාව නගර සභා ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන පරිදි පිළිගැනීමටත්, 1973. 09. 10 වෙනි දින පැවැත්වූ කොලොන්නාව නගර සභා රැස්වීමේ අංක 14(1) දරණ යෝජනාව ප්‍රකාර තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ගලගෙදරගේ සෝමසිරි,
සභාපති,
කොලොන්නාව නගර සභාව.

1973 ඔක්තෝබර් මස 08 වෙනි දින,
කොලොන්නාව නගර සභා කාර්යාලය,
වැල්ලම්පිටිය.

10–1017—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### අකුරැස්ස සුළු නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත

මෙහි පහත උප ලේඛනයේ දක්වෙන අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1974 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන අකුරැස්ස සුළු නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දිනයේ සිට දින 14 ක් ඇතුළත ලියා මා වෙත ඉදිරිපත් කළ යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙනු ලැබේ.

කේ. පී. ධර්මදාස,
සභාපති,
අකුරැස්ස සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
අකුරැස්ස, 73.10.12.

උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඒ. ආර්. ඇම්. වජිරු, රම්නා පාර, ගොඩපිටිය, අකුරැස්ස ... ... | ගව මස් වෙළඳ සැල, පොදු වෙළඳ පොල, අකුරැස්ස ... | ගව මස් |

10–801—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### හැටන්-දික්ඔය නගර සභාව

නගර සභා ආඥා පනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 162 හා 164 වැනි වගන්ති යටතේ හැටන්-දික්ඔය නගර සභාව විසින් පහත සඳහන් උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු 1974 වර්ෂයේ සිට පනවා අය කිරීමටත් එම වෙළඳ ව්‍යාපාරයන් වෙනුවෙන් 1965.02.12 දින අංක 14,319 දරණ ගැසට් නිවේදනයේ පළ කරන ලද ගාස්තු 1973. 12. 31 වෙනි දින සිට අවලංගු කිරීමට හැටන්-දික්ඔය නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඕ. දෙන් වීල් ප්‍රඩ්,
හැටන්-දික්ඔය නගර සභාවේ සභාපති.

1973. 09. 21 දින,
හැටන්-දික්ඔය නගර සභා
කාර්යාලයේ දීය.

උපලේඛනය

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| 1. කබොක්, බොරළු හෝ කළු ගල් කැණීම ... | 25 | 0 |
| 2. කබොක්, බොරළු හෝ කළු ගල් ගබඩා කිරීම ... | 10 | 0 |
| 3. සිසිල් බීම නිෂ්පාදනය ... ... | 150 | 0 |
| 4. ග්‍රෝස් එකකට (1) වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම ... | 50 | 0 |
| 5. අයිස් නිපදවීම ... ... | 10 | 0 |
| 6. කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| 7. යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කර්ෂණය ... | 25 | 0 |

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| 8. ගැලුම් 50ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| 9. පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| 10. ගිනිපෙට්ටි නිෂ්පාදනය ... | 100 | 0 |
| 11. ග්‍රොස් 10ට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| 12. ඉඹුල් පුළුන් හෝ කපු හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| 13. මැතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 25 | 0 |
| 14. ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම ... | 25 | 0 |
| 15. තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... | 50 | 0 |
| 16. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම ... | 10 | 0 |
| 17. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 25 | 0 |
| 18. පිදුරු ගබඩා කර තබා ගැනීම ... | 10 | 0 |
| 19. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම ... | 25 | 0 |
| 20. කුළියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම | 10 | 0 |
| 21. ධාන්‍ය හෝ මෑෂ බෝග හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... | 10 | 0 |
| 22. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත් වැඩියා කිරීම ... ... | 50 | 0 |
| 23. යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම ... | 100 | 0 |
| 24. අතින් ලී ඉරණ ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම ... ... | 10 | 0 |
| 25. දැව ගබඩාවක් පවත්වාගෙන යෑම ... | 50 | 0 |
| 26. දර ගබඩාවක් පවත්වාගෙන යෑම ... | 10 | 0 |
| 27. කිරි ගල් හෝ හුණු ගල් සඳහා හෑරීම ... | 15 | 0 |
| 28. යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යෑම ... | 100 | 0 |
| 29. යන්ත්‍රෝපකරණ පාවිච්චි නො කෙරෙන කම්හලක් පවත්වාගෙන යෑම ... | 25 | 0 |
| 30. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... | 100 | 0 |
| 31. හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම ... ... | 25 | 0 |
| 32. බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යෑම ... | 10 | 0 |
| 33. අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම ... ... | 10 | 0 |
| 34. පොල් කටු ගබඩාකර තබා ගැනීම ... | 10 | 0 |
| 35. ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 10 | 0 |
| 36. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩාකර තබා ගැනීම ... ... | 10 | 0 |
| 37. විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම ... | 25 | 0 |
| 38. අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම ... ... | 25 | 0 |
| 39. අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම ... ... | 50 | 0 |
| 40. සිල්ක් සහ කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු කිරීම | 25 | 0 |
| 41. මැසූ ඇඳුම් නිෂ්පාදනය ... | 25 | 0 |
| 42. මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම ... | 50 | 0 |
| 43. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම | 10 | 0 |
| 44. පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... | 20 | 0 |
| 45. හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම ... ... | 10 | 0 |
| 46. හම් ගබඩා කර තබා ගැනීම ... | 10 | 0 |
| 47. උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| 48. කුකුළන් 100ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යෑම ... ... | 10 | 0 |
| 49. බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම ... ... | 10 | 0 |
| 50. රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| 51. පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යෑම | 25 | 0 |
| 52. පූවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම | 10 | 0 |
| 53. තොග වශයෙන් විකිණීම සඳහා නරක්වනසුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| 54. කරවල, ලුණු මාළු හෝ ජාඩි හොණ්ඩර 3ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... | 10 | 0 |
| 55. මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම ... ... | 25 | 0 |
| 56. අඟුරු සඳහා දැව හෝ පොල් කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම ... | 15 | 0 |
| 57. සිමෙන්ති හොණ්ඩර 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... | 50 | 0 |
| 58. අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම ... | 10 | 0 |
| 59. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| 60. සත්ත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යෑම ... | 25 | 0 |
| 61. පුන්නක්කු හොණ්ඩර 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... | 10 | 0 |
| 62. සත්ත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම | 10 | 0 |
| 63. සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැසවීම ... | 10 | 0 |
| 64. සබන් නිෂ්පාදනය කිරීම ... | 25 | 0 |
| 65. සව් හෝ මංඤොක්කා කැට (ටැපියෝකා) නිපදවීම ... ... | 5 | 0 |
| 66. ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යෑම ... | 50 | 0 |
| 67. ට්‍රන්ක් පෙට්ටි සෑදීම ... ... | 10 | 0 |
| 68. අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම ... ... | 25 | 0 |
| 69. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම | 25 | 0 |
| 70. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම ... ... | 50 | 0 |
| 71. මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම | 50 | 0 |
| 72. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම... | 30 | 0 |
| 73. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම ... ... | 50 | 0 |
| 74. සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම ... | 50 | 0 |
| 75. රස කැවිලි වර්ග නිපදවීම ... | 10 | 0 |
| 76. පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම ... | 10 | 0 |
| 77. මේද නිපදවීම හෝ නිෂ්කර්ශනය කිරීම ... | 10 | 0 |
| 78. දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම | 10 | 0 |
| 79. දත් බුරුසු නිපදවීම ... | 10 | 0 |
| 80. රූ එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම | 50 | 0 |
| 81. විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම | 10 | 0 |
| 82. ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 25 | 0 |
| 83. හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම ... | 10 | 0 |
| 84. පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම | 10 | 0 |
| 85. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... | 10 | 0 |
| 86. ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම ... | 10 | 0 |
| 87. සෝඩා නිපදවීම ... ... | 10 | 0 |

### හැටන්-ඩික්ඔය නගර සභාව

පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වැනි අධිකාරය වන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි සහ 4 වැනි වගන්ති යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පිළියෙළ කරන ලදුව එම පනතේ 2 වැනි වගන්තියේ ප්‍රකාර අංක 15,001 දරණ 1972 මාර්තු 10 වෙනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ප්‍රකාශයට පත් කරන ලද මෙහි පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමටත් එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට හැටන්-ඩික්ඔය නගර සභා ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට හැටන්-ඩික්ඔය නගර සභාව 1973.07.28 වෙනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 17 (අ) දරණ යෝජනාවෙන් තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඕ. දෙන් විල්ප්‍රඩ්,
හැටන්-ඩික්ඔය නගර සභාවේ සභාපති.

1973 සැප්තැම්බර් 21 දින,
හැටන්-ඩික්ඔය නගර සභා කාර්යාලයේදීය.

### අතුරු ව්‍යවස්ථාව

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 නොවැම්බර් මස 06 වැනි දින අංක 10,609 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල VIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාළ අතුරු ව්‍යවස්ථා පහත සඳහන් වූ පරිදි වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

1. එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කරමි :—

"මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසෙහි II වැනි කොටසෙහි, III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ." තවද,

2. එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

### උපලේඛනය

#### I වැනි කොටස

##### අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කළු ගල් කැණීම.

කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම.

සිසිල් බීම නිෂ්පාදනය.

ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම.

අයිස් නිපදවීම.

කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කර්ශණය.

ගැළුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩාකර තබා ගැනීම.

පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ගිනි පෙට්ටි නිෂ්පාදනය.

ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනි පෙට්ටි ගබඩා කර තබා ගැනීම.

මැතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.

තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ, නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

හිඳුරු ගබඩා කර තබා ගැනීම.

පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම.

කුළියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම.

ධාන්‍ය හෝ මාෂ භෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

අතින් ලී ඉරණ ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.

දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.

දර ගබඩාවක් පවත්වාගෙන යෑම.

නිරිගල් හෝ හුණු ගල් සඳහා හෑරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යාම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි නො කෙරෙන කම්හලක් පවත්වාගෙන යෑම.

තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම.

බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩ පොලක් පවත්වාගෙන යෑම.

අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

පොල් කටු ගබඩා කර තබා ගැනීම.

ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම.

විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් විවීම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ පවත්වාගෙන යෑම.

අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.

සිල්ක් සහ කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු කිරීම.

මැසූ ඇඳුම් නිෂ්පාදනය.

මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

#### II වැනි කොටස

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

හම් ගබඩා කර තබා ගැනීම.

උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5කට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩාකර තබා ගැනීම.

කුකුළන් 100ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යෑම.

බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම.

රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පශු වෛද්‍ය ශිලත්හලක් පවත්වාගෙන යාම.

පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

තොග වශයෙන් විකිණීම සඳහා නරක්වනසුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.

කරවල, ලුණු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.

අඟුරු සඳහා දැව හෝ පොල් කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.

සිමෙන්ති හොණ්ඩර 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

සත්ත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යෑම.

පුන්නක්කු ටොන් 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

සත්ත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.

සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැසවීම.

සබන් නිෂ්පාදනය කිරීම.

සව් හෝ මඤ්ඤොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.

ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.

වුන්ක් පෙට්ටි සෑදීම.

අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.

ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.

කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.

සිරප් හෝ පලතුරු බීම වර්ග සෑදීම.

රස කැවිලි වර්ග නිපදවීම.

පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.

මේද නිපදවීම හෝ නිෂ්කර්ශණය කිරීම.

දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.

දත් බුරුසු නිපදවීම.

රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.

පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.

සෝඩා නිපදවීම.

කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියළි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.

සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.

පලතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.

කෝපි, ධාන්‍ය වර්ග මාෂ බෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම.

යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ බෝග කෙටීම.

බේකිං පවුඩර් නිපදවීම.

මාජරීන් නිපදවීම.

ගෑස් මැන්ටල් නිපදවීම.

පොට් නිපදවීම.

ඉටිපන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

රෙදි සෝදන නිල් නිපදවීම.

සායම් කූඩු නිපදවීම.

ලාකඩ නිපදවීම.

සුවඳ පූයර නිපදවීම.

පාසල් රට හුණු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසල් ගල්ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තැබීම.

ශීත කළ මස් හෝ මාළු ගබඩා කර තැබීම.

කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.

මැණික් ගල් කැපීම හා ඔප දැමීම.

දිය හුණු, සුදු (වයිට්) හුණු හෝ හිරි ගල් නිපදවීම.

එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

III වැනි කොටස

**අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර**

තලාතු මිණිරන් ශුද්ධ කිරීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු (කරදමුංගු), එන්සාල් හෝ කෙඳි වගී සකස් කිරීම.

ඩ්‍රයි ක්ලීනිං කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.

රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යෑම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වගෙන යෑම.

තෙල් හෝ සත්ත්ව මේද පැසවීම.

හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම.

මැටි බඳුන් ඔප දැමීම.

ගිනි කෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

හොණ්ඩර 3 ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම.

බැටරි චාර්ජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

වෑල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පොලක් පවත්වාගෙන යෑම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යෑම.

බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යෑම.

ගල් ස්මාරක නිපදවීම.

පැට්‍රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම.

පැට්‍රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරු කවි (කොයිල්ස්) නිපදවීම.

ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.

ගල් තාර හෝ වෙනත් බිටුමත්මය නිෂ්පාදන නිපදවීම.

වීදුරු භාණ්ඩ නිපදවීම.

වීදුරු කැඩපත් නිපදවීම.

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස්යන ඊයම් නිපදවීම.

ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.

කටු කම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන් නිපදවීම).

බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.

ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම.

සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

බ්රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවුණු කෙඳි වර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.

වියළි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

රන්කම් සුන්බුන් වලින් වටිනා ලෝහ නිශ්කර්ෂණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.

රේඩියේටර නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩ පළක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩ පළක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩ පළක් පවත්වාගෙන යෑම.

10-071/2—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

### පෑලියගොඩ නගර සභාව

**1974 වර්ෂයට දේපල වටිපණම් බද්ද**

නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 160 වන ඡේදය යටතේ 1974 අවුරුද්දට බලපවත්නා පරිදි පහත සඳහන් දේපල වටිපණම් බද්ද පැණවීමට පෑලියගොඩ නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

160 (3) වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුල පිහිටා තිබෙන සියළුම නිශ්චිල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට දහයක් බැගින් අයකරන බවත්, මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 දායින් අවසන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකි බවත් දන්වනු ලැබේ.

ජී. ඩී. ජේ. විජේසිංහ,
පෑලියගොඩ නගර සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
පෑලියගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

10–875/1—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### පෑලියගොඩ නගර සභාව

**1974 වර්ෂය සඳහා සුනඛ බද්ද**

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)**

(477 වැනි අධිකාරය) සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි ඡේදය ප්‍රකාර, පෑලියගොඩ නගර සභා සීමාව තුල ඇතිකරන සෑම බල්ලෙක් සඳහා රු. 1 ක්ද, සෑම බැල්ලියක් සඳහා රු. 1.50 ක්ද 1974 වර්ෂය වෙනුවෙන් පනවා ඇති අතර, මෙම බද්ද 1974 අප්‍රේල් මස 1 වැනි දිනට පෙර ගෙවිය යුතුව ඇත.

ජී. ඩී. ජේ. විජේසිංහ,
පෑලියගොඩ නගර සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
පෑලියගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

10–875/2—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### පෑලියගොඩ නගර සභාව

**රථවාහන හා සත්ව බද්ද—1974 වර්ෂය**

**නගර සභා ආඥාපනත (255 අධිකාරිය)**

(255 අධිකාරිය වන) නගර සභා ආඥාපනතේ 162 වන ඡේදය අනුව, පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන පරිදි රථවාහන හා සතුන් සඳහා බද්ද 1973 වර්ෂය තුල බල පැවැත්වූ බදු ප්‍රමාණ යන්ම 1974 වර්ෂයටද පනවා ඇති බවත්,

2. යටකී ආඥාපනතේ 163 (3) ඡේදය යටතේ එකී බද්ද 1974 මාර්තු මස 31 වෙනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්,

පෑලියගොඩ නගර සභාව මගින් මෙයින් ප්‍රකාශයට පමුණුවනු ලැබේ.

ජී. ඩී. ජේ. විජේසිංහ,
පෑලියගොඩ නගර සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
පෑලියගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| 1. මෝටර් කාර්, මෝටර් විකාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, රික්ෂෝ, පාපැදි සහ ට්‍රයිසිකල් හැරුණු විට අන් සෑම වාහනයක් සඳහා ... | 5 | 0 |
| 2. පාපැදි, ට්‍රයිසිකල්, පාපැදි කාර්, පාපැදි කරත්ත, ට්‍රයිසිකල් කාර් හෝ ට්‍රයිසිකල් කරත්ත සඳහා— | | |
| (අ) වෙළඳ කටයුතු සඳහා යොදවන්නේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳ කටයුතු වලින් තොර පාවිච්චිය සඳහා... | 1 | 0 |
| 3. ගොන් දෙන්නා බඳින කරත්ත සඳහා ... | 5 | 0 |
| 4. තනි ගොනා බඳින කරත්ත සඳහා ... ... | 3 | 0 |
| 5. තිරික්කල, බක්කි කරත්ත සහ අත් කරත්ත සඳහා ... | 3 | 0 |
| 6. රික්ෂෝ සඳහා ... ... ... | 2 | 50 |

10–875/3—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්යාලය—අම්බලන්ගොඩ නගරය

**1974 වර්ෂයට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු**

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි පරිච්ඡේදය)**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ ප්‍රකාර අම්බලන්ගොඩ නගර සභා සීමාව තුල තබාගත් සෑම බල්ලෙකුට හා බැල්ලියක වෙනුවෙන් 1973 වර්ෂයේ අය කරන ලද ගාස්තුව වන රුපියල් එකයි ශත පනහ (රු 1.50) 1974 වර්ෂයටද අය කිරීමට පනවා ඇති බවද එකී ගාස්තු 1974 අප්‍රියෙල් මස 1 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

කෝලිත වල්ගමගේ,
විශේෂ කොමසාරිස්—අම්බලන්ගොඩ නගරය.

1973 ඔක්තෝබර් මස 13 වෙනි දින,
අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–871/1—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්යාලය—අම්බලන්ගොඩ නගරය

**1974 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 162 වැනි වගන්තිය යටතේ රථ වාහන හා සතුන් පිළිබඳ බද්දක් 1973 වර්ෂයේ බල පැවැත් වෙමින් තිබෙන පරිදිම 1974 වර්ෂයට අය කිරීමට මා විසින් පනවා තිබෙන බවද යථෝක්ත ආඥාපනතේ 163 (3) වගන්තිය යටතේ එකී බද්ද 1974 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, බයිසිකල්, ලොරි, මෝටර් පාපැදි හෝ කරත්ත, අත් කරත්ත, ජින් රික්සෝ රථ, බයිසිකල් හෝ ට්‍රයිසිකල් පාපැදි හැර වෙන ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... | 5 | 0 |
| සෑම බයිසිකලයක් රෝද තුනේ බයිසිකල්යක් නම්— | | |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙනත් ඕනෑම කාර්යයක් සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... | 1 | 0 |
| (ඇ) ඕනෑම අන්දමක කරත්තයක් වෙනුවෙන් ... | 4 | 0 |
| (ඉ) ඕනෑම අන්දමක අත් කරත්තයක් වෙනුවෙන් ... | 4 | 0 |
| (ඊ) ඕනෑම අන්දමක ජින් රික්සෝ රථයක් වෙනුවෙන් ... | 2 | 50 |
| (උ) ඕනෑම අශ්වයෙක් අශ්ව පෝනියෙක් හෝ මියුලෙක් ... | 4 | 0 |

කෝලිත වල්ගමගේ,
විශේෂ කොමසාරිස්—අම්බලන්ගොඩ නගරය.

1973 ඔක්තෝබර් මස 13 වෙනි දින,
අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

10–871/2—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

### කහවත්ත නගරය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් කොට ඇති ස්ථානයේ 1974 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම්කොට තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන කහවත්ත නගර සීමාව තුල යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලකින් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| (1) ඇම්. ඒ. ඇස්. කාදිබාවා, 16/කේ. ඇතුල් රවුම් පාර, රත්නපුරය | කහවත්ත පොදු වෙළඳ පොලේ එළු හරක් මස් කඩය. |
| (2) පී. ඇස්. රාජානන්දන්, 5, ධර්මපාල මාවත, රත්නපුරය | කහවත්ත පොදු වෙළඳ පොලේ එළු මස් කඩය. |

ආර්. කේ. එච්. ඇම්. ප්‍රනාන්දු,
කහවත්ත නගරයේ විශේෂ කොමසාරිස්.

1973
කහවත්ත විශේෂ කොමසාරිස් කාර්යාලයේදිය.

10–963—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්යාලය, නාවලපිටිය නගරය

1974 සුනඛ බද්ද

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වන පරිච්ඡේදයේ 4 වන ඡේදයේ යටතේ නාවලපිටිය නගර සීමාව තුල තබාගන්නා බල්ලෙකුගෙන් රු. 1.25 ක් ද බැල්ලකගෙන් රු. 2.50 ක් ද අයකරන බවත්, එම ගාස්තු 1974 මාර්තු මස 31 වෙනි දිනට පෙර ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. ඊ. පීරිස්,
විශේෂ කොමසාරිස්, නාවලපිටිය නගරය.

1973 ඔක්තෝබර් මස 09 වෙනි දින,
නාවලපිටිය විශේෂ කොමසාරිස් කාර්යාලයේදිය.

10–962/1—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්යාලය, නාවලපිටිය නගරය

1974 වාහන සහ සත්ව බද්ද

පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 255 වැනි පරිච්ඡේදයේ අංක 162 දරණ වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනය අනුව 1974 වර්ෂයට වාහන සහ සතුන් පිළිබඳ බද්දක් පනවා ඇති බව ද, එම පනතේ අංක 163 (3) යටතේ එම බදු මුදල 1974 මාර්තු මස 31 වෙනි දිනට පෙර ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| 1. මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර වෙනත් ඕනෑම රථයක් සඳහා ... | 5 | 0 |
| 2. බයිසිකල්, රෝද තුනේ බයිසිකලයක්, බයිසිකල් රථයක් හෝ කරත්තයක් හෝ රෝද තුනේ බයිසිකල් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම් සඳහා යොදනු ලැබේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාම හැර වෙනත් කාර්යයක් සඳහා යොදනු ලැබේ නම් ... ... | 1 | 0 |
| 3. තනි ගොනා හෝ ගොන් දෙන්නා බැඳි තිරික්කලයක් හෝ කරත්තයක් ... ... | 3 | 0 |
| 4. අත් කරත්තයක් ... ... | 2 | 0 |
| 5. ජින් රික්ෂෝ රථයක් ... ... | 1 | 50 |
| 6. අශ්වයකු, පෝනියකු, කොටළුවකු ... ... | 3 | 0 |
| 7. ගොනකු හෝ බූරුවකු ... ... | 1 | 0 |

ඩබ්ලිව්. ඒ. ඊ. පීරිස්,
විශේෂ කොමසාරිස්, නාවලපිටිය නගරය.

1973 ඔක්තෝබර් මස 9 වෙනි දින,
නාවලපිටිය විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

10–962/2—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### බණ්ඩාරවෙල නගරය

නගර සභා ආඥාපනත

1974 වර්ෂය සඳහා දේපොල බද්ද

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරිය යටතේ මෙම ගතවී යන 1973 වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපොල බදු 1974 වර්ෂයටද එලෙසම පැනවීමට බණ්ඩාරවෙල නගරයේ විශේෂ කොමසාරිස් වන මම මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

160 (3) වගන්තිය ප්‍රකාර බණ්ඩාරවෙල නගරය තුල පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපොලවල වාර්ෂික වටිනාකමෙන් සියයට 11 බැගින් වාර්ෂික බදු, පිළිවෙලින් මාර්තු 31 දායින්, ජූනි 30 දායින්, සැප්තැම්බර් 30 දායින් හා දෙසැම්බර් 31 දායින් අවසන්වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකිවේ.

ආර්. සා. ඇස්. පෙරේරා,
විශේෂ කොමසාරිස්,
බණ්ඩාරවෙල නගරය.

1973 ඔක්තෝබර් මස 12 වැනි දින,
බණ්ඩාරවෙල විශේෂ කොමසාරිස් කාර්යාලයේදීය.

10–960—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### ගලේවෙල සුළු නගර සභාව

1974 වර්ෂයට සුනඛ බදු

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)**

477 වැනි අධිකාරය වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර ගලේවෙල සුළු නගර සභා බල මණ්ඩලය තුල තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රු. 1.00 බැගින් ද, ගැණු සුනඛයෙක් සඳහා රු. 1.50 බැගින් ද, 1974 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1974 වැනි වර්ෂයට අය කිරීමට පනවා ඇති බව ගලේවෙල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ල. ජ. ද සිල්වා වික්‍රමසූරිය,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

1973 ක්වූ ඔක්තෝබර් මස 15 වන දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේ දී.

10—950/1—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

### ගලේවෙල සුළු නගර සභාව

1974 වර්ෂයට රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

**සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)**

ගලේවෙල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයෙන් විස්තර වන ගණන් අනුව 1974 වර්ෂයට රථවාහන සහ සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ අංක 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින්ද වේ.

ල. ජ. ද සිල්වා වික්‍රමසූරිය,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

1973 ක්වූ ඔක්තෝබර් මස 15 වන දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේදී.

උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, ජින් රික්ෂෝ රථ, පා පැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... ... | 5 0 |
| හැම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 2 50 |
| (බී) වෙළඳාමට හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 4 0 |
| තනි ගොනා බැඳි සෑම බර බාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 3 0 |
| සෑම අන් කරත්තයක් සඳහා ... ... | 3 0 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 2 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙකුට ... | 5 0 |
| සෑම බූරුවෙකුට හෝ ගොනෙකුට ... ... | 1 0 |

10—950/2—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### වැලිමඩ සුළු නගර සභාව

1974 වර්ෂයට දේපල බද්ද

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනත යටතේ මෙම ගතවී යන 1973 වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1974 වර්ෂයටද එලෙසම පැනවීමට වැලිමඩ සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඉහත සඳහන් ආඥාපනතේ 159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුල පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර (4%) වාර්ෂික බද්ද පිළිවෙලින් මාර්තු 31 වැනි දින, ජූනි 30 වැනි දින, සැප්තැම්බර් 30 වැනි දින සහ දෙසැම්බර් 31 වැනි දින ඒ ඒ කාර්තුවේ අවසන් දිනයන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකිවේ.

ඩබ්ලිව්. අමරියස් සිල්වා,
වැලිමඩ සුළු නගර සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
වැලිමඩ සුළු නගර සභා කාර්‍යාලයේදීය.

10-973/1—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### වැලිමඩ සුළු නගර සභාව

1974 වර්ෂයට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)**

(477 වැනි අධිකාරය වන) සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තිය යටතේ වැලිමඩ සුළු නගර සභා සීමාව ඇතුළත ඇතිකර සිටින බල්ලෙකු සඳහා රු. 1 ක් ද, සෑම බැල්ලක සඳහා රු. 2.50 ක් ද වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1974 වර්ෂයට පනවා ඇති බවත්, එකී ගාස්තු 1974 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. අමරියස් සිල්වා,
වැලිමඩ සුළු නගර සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
වැලිමඩ සුළු නගර සභා කාර්‍යාලයේදීය.

10-973/2—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### වැලිමඩ සුළු නගර සභාව

1974 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

**සුළු නගර සභා ආඥාපනත (256 වන අධිකාරය)**

වැලිමඩ සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) (256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව 1974 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමටද එම බද්ද මෙම ගතවී යන 1973 වර්ෂයේ බද්දට සමාන බවද,

(2) එකී ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එම බදු 1974 මාර්තු 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින්ද වේ.

උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| 1. මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හැර වෙනත් ඕනෑම වර්ගයේ වාහනයක් සඳහා ... | 5 0 |
| 2. සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්, නැතහොත් මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 5 0 |
| (ආ) වෙළඳාම හැර වෙනත් කටයුතු සඳහා නම් ... | 1 0 |
| 3. ගොන් දෙන්නා බඳින සෑම බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 0 |
| 4. තනි ගොනා බඳින බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 2 50 |
| 5. සෑම අන් කරත්තයක් සඳහා ... ... | 4 0 |
| 6. සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... | 2 50 |
| 7. සෑම අශ්වයෙක්, පෝනියෙක්, කොටළුවෙක් සඳහා ... | 5 0 |
| 8. සෑම ගොනෙකු හෝ බූරුවකු සඳහා ... | 1 0 |

ඩබ්ලිව්. අමරියස් සිල්වා,
වැලිමඩ සුළු නගර සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
වැලිමඩ සුළු නගර සභා කාර්‍යාලයේදීය.

10-973/3—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

### කටුනායක-සීදූව නගර සභාව

1973 වර්ෂය සඳහා වරිපනම් ලේඛන

1973 වර්ෂය සඳහා වරිපනම් ලේඛන දැනට සූදානම් බවත්, කාර්යාල වේලාවන්හිදී එම පොත් පරීක්ෂා කල හැකි බවත්, නගර සභා ආඥාපනතේ (255 වෙනි පරිච්ඡේදය) 116 කාණ්ඩය හා සම්බන්ධව නාගරික ආඥාපනතේ (252 පරිච්ඡේදය) 235 (1) සහ (2) කාණ්ඩය යටතේ මෙයින් මහජනයා වෙත දැනුම් දෙමි.

ෂෙල්ටන් පැට්‍රික් පලිහවඩන,
සභාපති,
කටුනායක-සීදූව නගර සභාව.

නගර සභා කාර්යාලය,
සීදූව,
1973 ඔක්තෝබර් 06 වැනි දින දී ය.

10—789—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### ගලේවෙල සුළු නගර සභාව

සුළු නගර සභා ආඥාපනත

1974 වර්ෂයට දේපල බද්ද

256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත යටතේ ගතවී ගෙන යන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බද්ද මෙම සුළු නගර සභා ප්‍රදේශය තුළ 1974 වර්ෂයටද එලෙසම පනවා අය කිරීමට ගලේවෙල සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත්කරමි.

159 වන වගන්තිය ප්‍රකාර ගලේවෙල සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින්වූ වාර්ෂික දේපල බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු හතරකට ගෙවිය යුතුවේ.

ල. ජ. ද සිල්වා වික්‍රමසූරිය,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

1973ක්වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේදීය.

10-949—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිතයට දක්වන XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව උතුර ගම්සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, 1973 ජූනි 29 වන දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 6 (1) දරණ යෝජනාව අනුව තීරණය වූ බව අඹගමුව උතුර ගම්සභාවේ සභාපති වන වැසියේන ජේම්ස් ජිනදාස වන මම මෙයින් දන්වා සිටිමි.

ඩබ්ලිව්. ජේ. ජිනදාස,
අඹගමුව උතුර ගම්සභාවේ සභාපති.

1973 ඔක්තෝබර් මස 01 වන දින,
ගිනිගත්හේනේ පිහිටි,
අඹගමුව උතුර ගම්සභා කාර්යාලයේදී ය.

අතුරු ව්‍යවස්ථාව

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල VXIII වන කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථාව පහත සඳහන් පරිදි වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

1. එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථා ආදේශ කිරීමෙන් :—

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උප ලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I. වැනි කොටසේ හෝ II වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ."

තවද,

2. එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනයේ අන්තර්ගත කිරීමෙන් :—

උපලේඛනය

I වැනි කොටස—අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කළුගල් කැනීම.
කබුක්, බොරළු හෝ කලුගල් ගබඩා කිරීම.
සිසිල් බීම නිෂ්පාදනය.
ග්‍රෝස් 1ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කර්ශණය.
ගැලුම් 50ට වැඩි ප්‍රමාණයක පෙට්‍රල් තෙල් ගබඩා කර ගැනීම.
පොල් තෙල් හැර වෙන එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ගිනිපෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෙ ස් 10ට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩා කර තබා ගැනීම.
ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් ගබඩා කර ගැනීම.
මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර ගැනීම.
ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පිදුරු ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම.
කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම.
ධාන්‍ය හෝ මාෂභෝග හොන්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වා ගෙන යාම.
අතින් ලී ඉරණ ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන ගෙන යාම.
දැව ගබඩාවක් පවත්වාගෙන යාම.
දර ගබඩාවක් පවත්වාගෙන යාම.
හිරිගල් හෝ හුණු ගල් සඳහා හෑරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවත්වාගෙන යාම.
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, හුණු හෝ සීනි හොන්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
හිස් බෝතල් හෝ හිස් ජෝග්නි ගබඩා කර තබා ගැනීම.
බයිසිකල් හෝ මෝටර් බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙන යාම.
අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පොල්කටු ගබඩා කර තබා ගැනීම.
ගෙන් දගම් හෝ ගෙන් දගම් කුඩු හොන්ඩර 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි ගබඩා කර තබා ගැනීම.
විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.
සිල්ක් හා කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු කිරීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

II වැනි කොටස—අප්‍රසන්න ව්‍යාපාර

මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පෝර හෝ රසායනික පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
හම් ගබඩා කර තබා ගැනීම.
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොන්ඩර 5කට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම.

කුකුළන් 100 කට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යෑම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම් වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
කරවල, උණුමාළු හෝ ජාඩි හොණ්ඩර තුනකට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.
අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම.
පුන්නක්කු ටොන් 1 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
සත්ව ආහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැසවීම.
සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මංඤොක්කා කැට් "ටැපියෝකා" නිපදවීම.
ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යාම.
ටින්ක් පෙට්ටි සෑදීම.
අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.
ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැල්වලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.
සිරප් හෝ පලතුරු බීම වර්ග සෑදීම.
රස කැවිලි වර්ග නිපදවීම.
පොල් ලෙලි හෝ දැව පළු කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම.
මේද නිපදවීම හෝ නිශ්කර්ෂණය කිරීම.
දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.
දත් බුරුසු නිපදවීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
විනාකිරි එකතු කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
හුණුගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.
පෑණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම.
ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.
කෝඩා නිපදවීම.
කෙඳි සායම් කිරීම.
කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.
සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
පළතුරු, මාළු වර්ග හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.
කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂභෝග කෙටීම.
බේකිං පවුඩර් සෑදීම.
මාජරීන් නිපදවීම.
ගෑස් මැන්ටල් නිපදවීම.
පොට් නිපදවීම.
ඉටිපන්දම් නිපදවීම.
කපුරු නිපදවීම.
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
රෙදි සෝදන නිල් නිපදවීම.
සායම් කුඩු නිපදවීම.
ලාකඩ නිපදවීම.
සුවඳ පුයර නිපදවීම.
සාසල් රටහුණු නිපදවීම.
ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
වැලි කඩදාසි නිපදවීම.
ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.
පාසල් ගල්ලෑලි නිපදවීම.
සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
සෙල්ලම් බඩු නිපදවීම.
මුද්‍රා පාසි සකස් කිරීම හා ගබඩා කර තැබීම.
සීතකල මස් හෝ මාළු ගබඩා කර තැබීම.
ජලාපු පොල් නිපදවීම.
ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
මැණික් ගල් කැපීම හා ඔප දැමීම.
දිය හුණු, සුදු වයිටින් හුණු හෝ හිරිගල් නිපදවීම.
එන්සහල් "කරදමුංගු" සකස් කිරීම හෝ වේලීම.

## III වැනි කොටස—අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිරන් ශුද්ධ කිරීම.
රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු, එන්සාල් "කරදමුංගු" හෝ කෙඳි වර්ග සකස් කිරීම.
ඩ්‍රයි ක්ලීනිං කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.
රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.
විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
තෙල් හෝ සත්ව මේද පැසවීම.
හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම.
මැටි බඳුන් ඔප දැමීම.
ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
මෝරවරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හොණ්ඩර තුනකට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම.
බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
වෑල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම.
බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.
වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.
ගල් ස්මාරක නිපදවීම.
පැට්රල්, ඩීසල්තෙල් හෝ වෙන යම් ඛණිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වා ගෙන යාම.
පැට්රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
මෝටර් වාහන සඳහා බොඩි නිපදවන ස්ථානයක් පවත්වාගෙන යෑම.
පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.
කෘෂිරසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.
මදුරු කව "කොයිල්ස්" නිපදවීම.
ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.
රබර් ද්‍රාවක් හෝ රබර් සිමෙන්ති නිපදවීම.
ගල් තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම.
වීදුරු භාණ්ඩ නිපදවීම.
වීදුරු කැඩපත් නිපදවීම.
යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.
පාස්සන ඊයම් නිපදවීම.
ඇලුමිණියම් භාණ්ඩ නිපදවීම.
කටුකම්බි නිපදවීම.
කම්බි ඇණ නිපදවීම.
කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි "රිබන්" නිපදවීම.
බෙලෙක් බඳුන් වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.
ජී. අයි. බාල්දි නිපදවීම.
වායු සමන යන්ත්‍ර සීතකරණ හෝ අධි සීතකරණ "ඩීප් ෆ්‍රීසර්" නිපදවීම.
සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
බ්රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.
යන්ත්‍රෝපකරණ නිපදවීම.
විදුලි භාණ්ඩ නිපදවීම.
රබර් කැවූණු කෙඳි වර්ග නිපදවීම.
සංචායක බැටරි නිපදවීම
වියලි කෝෂ බැටරි නිපදවීම.
ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිෂ්කර්ශණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
වරක්මර් රථ එකලස් කිරීම.
රේඩියේටර් නිපදවීම.
විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරණ වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යාම.

10-961—73. 10. 26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

**තෝල්ලංගමුව ගම්සභාව**

ගම්සභා ආඥාපනත (257 වැනි අධිකාරය)

කෑගලු දිස්ත්‍රික්කයේ තෝල්ලංගමුව ගම්ප්‍රදේශයේ තෝල්ලංගමුව ගම්සභාව විසින් 1973. 9. 18 වෙනි දින පැවැති ගම්සභා රැස්වීමේදී සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ. යෝජිත කරුණ සම්බන්ධයෙන් ඉඩම් හිමියන් හෝ ප්‍රදේශවාසි මහජනතාව විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධවන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දහහතර දිනක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, මෙකී කාලය තුල යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු මෙහි පහත උප ලේඛණයේ දැක්වෙන පාර ගම්සභාව සතු දේපොලක් හැටියට සලකා පාලනය කරනු ලබන බවත් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

කේ. ඒ. රණසිංහ,
තෝල්ලංගමුව ගම්සභාවේ සභාපති.

1973. 10. 2 වැනි දින,
තෝල්ලංගමුව ගම්සභා කායඞාලය,
මාසින් නොලුව,
දොරවක.

**යෝජනාව**

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වගන්තිය යටතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ තෝල්ලංගමුව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් 1965. 12. 31 දින අංක 14,601 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV කොටසේ ප්‍රකාශයට පත්කරන ලද පොදු අතුරු ව්‍යවස්ථාවල 4 වන කාණ්ඩයේ (1) වන අතුරු ව්‍යවස්ථාව අනුව මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ මංමාවත් ඉදිරියේ දැක්වෙන දිග පලල අනුව සාදා හෝ නැවත සාදා ගැනීම හෝ ප්‍රතිසංස්කරණය කරගැණීම හෝ පවත්වාගෙන යාම හෝ කළයුතු බවද, මෙම කාණ්ඩයේ (6) වෙනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර තෝල්ලංගමුව ගම්සභාවේ සභාපතිතුමාගේ ලියවිලි සහිත අවසරයක් නොමැතිව පහත දැක්වෙන උප ලේඛණයේ සඳහන් මාවතේ ලොරි බස් හෝ ටොන් 1½ ක් හෝ ඊට වැඩියෙන් බර ඇති වෙනත් ඕනෑම වර්ගයක වාහනයක් ධාවනය කිරීම තහනම් කිරීමටත් සභාපති කේ. ඒ. රණසිංහ හා ආර්. පී. තිලකරත්න යන මහතුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් තීරණය විය.

**අංක 6 ගනේ ගම කොට්ඨාශය.**

1. පාරේ දිග — දම්වැල් 20
   පලල—අඩි 12

**මායිම්**

1. ඇම්. පී. බණ්ඩියා, කේ. පී. සිංඤෝ, ජිනදාස යන අයට අයිති නාරංගහමුල වත්ත. නැගෙනහිරට හා බස්නාහිරට (ඉඩම මැදින්),
2. කේ. පී. මාටින්, කේ. පී. අප්පුවා යන අයට අයිති නාරංගහමුල වත්ත මැද්දෙන් නැගෙනහිරට හා බස්නාහිරට,
3. කේ. පී. කිරිබණ්ඩියා, ජේ. පී. සේතුවා යන අයට අයිති නාරංගහමුල වත්ත නැගෙනහිරටද, කේ. පී. ගුණසිංහට අයිති නාරංගහමුල වත්ත—බස්නාහිරටද,
4. කේ. පී. ජේම්ස්ට හා එම සහෝදරයින්ට අයත් මාරපලයාගේ වත්ත මැදින් නැගෙනහිරට හා බස්නාහිරට,
5. ඇම්. පී. ධම්දාසට සහ සහෝදරයින්ට අයිති මැටිගැහුනැන්න ඉඩම මැදින් උතුරට හා දකුණට,
6. කේ. පී. ඇල්. පුංහුලාට සහ එම ධම්දාස අයිති අඹතැන්නේ ඉඩම මැදින් උතුරට හා දකුණට,
7. කේ. ජී. ආරියරත්නට අයිති අඹතැන්නේ ඉඩම මැදින් උතුරට හා දකුණට,
8. වික්‍රමසිංහ අද්වකාත් මහත්මයින්ට අයිති මාදෙනිය තේ කොටසේ කපා ඇති අවුන් පාර උතුරට හා දකුණට තේ ඉඩම.

10–783—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

**පිළියන්දල සුළු නගර සභාව**

මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි නම් සඳහන් අයවළුන් විසින් එහි සඳහන් ස්ථානයෙහි 1974 වර්ෂයට මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස බලපත්‍රයක් ඉල්ලා අයදුම්පතක් මා වෙත ඉදිරිපත් කර ඇත. මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම්දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන පිළියන්දල සුළු නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් කුමන හේතු නිසාදයන වග ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙමි.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇම්. එච්. ඇම්. අබ්දීන්, 34, හේනමුල්ල, පානදුර ... ... | හරක් මස් ... | ප්‍රසිද්ධ වෙළඳපල අංක 15 දරණ කඩය. |
| 2. කේ. ඇම්. සමීම්, 338, හේනමුල්ල, පානදුර ... ... ... | එළු මස් ... | ප්‍රසිද්ධ වෙළඳපල අංක 15/1 දරණ කඩය |

දයා කුලරත්න,
සභාපති,
පිළියන්දල සුළු නගර සභාව.

1973 ඔක්තෝබර් මස 9 වෙනි දින,
පිළියන්දල සුළු නගර සභා කාර්යාලයේ දීය.

10-955—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

**කන්තලේ සුළු නගර සභාව**

ගෝඝාතක ආඥාපනත

මෙහි පහත දක්වෙන උප ලේඛණයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1974 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන, කන්තලේ සුළු නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන්කර පිට පත් දෙකකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, 272 වැනි අධිකාරය වන ගෝඝාතක ආඥාපණතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාමේ පිළිවෙල |
|---|---|---|
| ඇම්. උමර් කත්තා 219, අබ්දුල් මජීද් මාවත, පෝට්නුකාටුව, කන්තලේ | කන්තලේ පොදු වෙළඳ පොලේ අංක 1 දරණ හරක් මස් කඩය... | එළු හරක් මස් |

කේ. ජී. ප්‍රේමදාස,
සභාපති,
කන්තලේ සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලයය,
කන්තලේ, 73.10.07 දින.

10–784—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

## අගලවත්ත සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උප ලේඛනයේ සඳහන් අය විසින් ඒ අයගේ නම් ඉදිරියෙන් සඳහන් ස්ථානයන්හි 1974 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බල පත්‍රයක් ඉල්ලා මා වෙත අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එහි බලපත්‍ර නිකුත් කිරීම ගැන අගලවත්ත සුළු නගර සභා සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ අසවල් කරුණ මතයැයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුලතදී මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|---|
| 1. | ඒ. අයි. කබීර් මහතා, නො. 11, කෙලින් වීදිය, මතුගම ... | ... හරක් මස් ... | අගලවත්ත පොදු වෙළඳ පොලේ හරක් මස් කඩය |
| 2. | ඒ. අයි. කබීර් මහතා, නො. 11, කෙලින් වීදිය, මතුගම ... | ... එළු මස් ... | අගලවත්ත පොදු වෙළඳ පොලේ එළු මස් කඩය |

ඒ. ඩී. මර්වින් සමරනායක,
සභාපති,
අගලවත්ත සුළු නගර සභාව.

1973 ඔක්තෝබර් මස 9 වෙනි දින,
අගලවත්ත සුළු නගර සභා කාර්යාලයේ දීය.

10–965—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

## පලාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

(261 වැනි අධිකාරය) පලාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ) 2 වැනි සහ 4 වැනි වගන්ති යටතේ රාජ්‍ය පරිපාලන, පලාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පිළියෙල කරන ලදුව, එම පනතේ 2 වැනි වගන්තිය යටතේ, අංක 15,001 දරණ 1972 මාර්තු මස 10 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ප්‍රකාශයට පත් කරන ලද මෙහි පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව පිලිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පලවන දින සිට, මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල ගම් ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමටත්, දික්වැල්ල ගම් ප්‍රදේශයේ පරිපාලන නිලධාරී වන ම විසින් තීරණය කරමි.

පී. බී. විල්සන්,
දික්වැල්ල ගම් ප්‍රදේශයේ පරිපාලන නිලධාරී.

1973 ඔක්තෝබර් මස 15 දින,
දික්වැල්ල ගම් ප්‍රදේශයේ පරිපාලන නිලධාරී කාර්යාලයේ දීය.

### අතුරු ව්‍යවස්ථා

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා වල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවල අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිත ව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ" තවද,

(2) එම කොටසේ අවසානයට පහත දැක්වෙන උපලේඛණය අන්තර්ගත කිරීමෙන් :—

#### උපලේඛනය

I වැනි කොටස—අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරලු හෝ කලුගල් කැණීම
කබුක්, බොරලු හෝ කලුගල් ගබඩා කිරීම
සිසිල් බීම නිෂ්පාදනය
ග්‍රොස් 10 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩාකර තබා ගැනීම.
අයිස් නිපදවීම.
කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් ඒලවළු තෙල් නිශ්කර්ෂණය.
ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩා කර තබා ගැනීම.
වෙනත් එලවළු තෙල් වර්ගයක් ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ගිනිපෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිණි පෙට්ටි ගබඩා කර තබා ගැනීම.
ඉඹුල් පුලුන් හෝ කපු හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම.
මැතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
ගඩොල් හෝ උලු ගබඩා කර තබා ගැනීම.
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වගී නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වගිවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පිදුරු ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කල ඇඳුම් ගබඩා කර තබා ගැනීම.
කුලියට දීම සඳහා ලැම්පු ගබඩා කර තබා ගැනීම.
ධාන්‍ය හෝ මාෂ භෝග හොන්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ස්වර්ණ හරන නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චිකරන ලී ඉරුම් මෝලක් පවත්වා ගෙන යාම.
අතින් ලී ඉරන ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.
දැව ගබඩාවක්, පවත්වා ගෙන යාම.
දර ගබඩාවක් පවත්වා ගෙන යාම.
හිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වා ගෙන යාම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි නො කෙරෙන කම්හලක් පවත්වා ගෙන යාම.
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15ට වැඩි නිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම.
බයිසිකල් හෝ මෝටර් සයිකල් අලුත් වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වා ගෙන යාම.
අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පොල් කටු ගබඩා කර තබා ගැනීම.
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම.

විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වා ගෙන යාම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැරීම හෝ විවීම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.
සිල්ක් සහ කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු කිරීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම.

## II වැනි කොටස—අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පොර හෝ රසායන පොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වා ගෙනයාම.
හම් ගබඩා කර තබා ගැනීම.
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම.
කුකුලන් 100ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වා ගෙනයාම.
බැටලුවන්, එලුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වා ගෙන යාම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වා ගෙන යාම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුලු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
කරවල, ලුනු, මාලු හෝ ජාඩි හොණ්ඩර 3ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
මාලු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.
අඟුරු සඳහා දැව හෝ පොල් කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර ගබඩාවක් පවත්වා ගෙන යාම.
පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැසවීම.
සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මැංඤොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.
ඇටකටු ගබඩාකිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වා ගෙන යාම.
චිරත්ත් පෙට්ටි සෑදීම.
අලුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.
ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
ගෘහභාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කල භාණ්ඩ ගබඩාකර තබා ගැනීම.
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකර තබා ගැනීම.
සිරප් හෝ පලතුරු බීම වර්ග සෑදීම.
රස කැවිලි වර්ග නිපදවීම.
පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වා ගෙන යාම.
මේද නිපදවීම හෝ නිෂ්කර්ශණය කිරීම.
දත් බුරුසු හැර වෙනත් බුරුසු නිපදවීම.
දත් බුරුසු නිපදවීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.
විනාකිරි විකිණීම හෝ ගබඩා කර තබා ගැනීම.
ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
හුණුගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.
පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.
කෝඩා නිපදවීම.
කෙඳි සායම් කිරීම.
කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩාකර තබා ගැනීම.
සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙනයාම.
පළතුරු, මාලු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.
කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුලුබඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ භෝග ඉකටීම.
බේකිං පවුඩර් නිපදවීම.
මාජරින් නිපදවීම.
ගෑස් මැන්ටල් නිපදවීම.
පොට් නිපදවීම.
ඉටිපන්දම් නිපදවීම.
කපුරු නිපදවීම.
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
රෙදි සෝදන නිල් නිපදවීම.
සායම් කුඩු නිපදවීම.
ලාකඩ නිපදවීම.
සුවඳ පුසර නිපදවීම.
පාසැල් රටහුණු නිපදවීම.
ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යාම.
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
වැලි කඩදාසි නිපදවීම.
ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.
පාසැල් ගල් ලෑලි නිපදවීම.
සෞඛ්‍ය තුවා කඩ නිපදවීම.
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
සෙල්ලම් බඩු නිපදවීම.
මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම.
සීත කල මස් හෝ මාලු ගබඩා කර තබා ගැනීම.
කපාපු පොල් නිපදවීම.
ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
මැණික් ගල් කැපීම හා ඔප දැමීම.
දිය හුණු, සුදු (වයිටිං) හුණු හෝ හිරිගල් නිපදවීම.
එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

## III වැනි කොටස—අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් ශුද්ධ කිරීම.
රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු, (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.
ඩ්‍රයි ක්ලීනිං කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වා ගෙන යාම.
රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම.
විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.
තෙල් හෝ සත්ව මේද සැපයීම.
හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම.
මැටි බඳුන් ඔප දැමීම.
ගිණි කෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වා ගෙන යාම.
මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හොණ්ඩර 3 ට වැඩියෙන් පෝ ගබඩා කර තබා ගැනීම.
බැටරි චාජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වා ගෙන යාම.
මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වා ගෙන යාම.
බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යාම.
යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.
වාත්තු මඩුවක් පවත්වා ගෙන යාම.
බේලෙක් වැඩපලක් පවත්වා ගෙන යාම.
ගල් ස්මාරක නිපදවීම.
පැට්රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛණිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වා ගෙන යාම.
පැට්රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වා ගෙන යාම.
මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වා ගෙන යාම.
පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.
කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.
මදුරු කවා (කොයිල්ස්) නිපදවීම.
ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.
රබර් ද්‍රව්‍ය හෝ රබර් සිමෙන්ති නිපදවීම.
ගල් තාර හෝ වෙනත් බිටුමන්වය නිෂ්පාදන නිපදවීම.
වීදුරු භාණ්ඩ නිපදවීම.
වීදුරු කැඩපත් නිපදවීම.
යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.
පාස්සන ඊයම් නිපදවීම.
ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.
කටු කම්බි නිපදවීම.
කම්බි ඇණ නිපදවීම.
කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.

ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සමන යන්ත්‍ර, ශීත කරන හෝ අධි ශීත කරන (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම, සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවුනු කෙඳි වශී නිපදවීම.

සංචායන බැටරි නිපදවීම.

වියලි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙනයාම.

යම් යම් සුන්බුන් වලින් වටිනා ලෝහ නිශ්කර්ෂණය සඳහා ස්ථානයක් පවත්වාගෙනයාම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.

රේඩියෝ ටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩ පලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩ පලක් පවත්වා ගෙන යාම.

10–877—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත—257 වන අධිකාරය

#### මාම්පේ-කැස්බෑව ගම් සභාව

කොළඹ දිස්ත්‍රික්කයේ මාම්පේ-කැස්බෑව ගම්සභාව විසින් 1973 ක්වූ සැප්තැම්බර් මස 28 වෙනි දින පෙරවරු 9 ට ඉහත සඳහන් ගම්සභා කාර්යාලයේදී පවත්වන්නට යෙදුන මාසික සභා රැස්වීමේදී සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

සරත් ඇල්විටිගල,
සභාපති,
මාම්පේ-කැස්බෑව ගම් සභාව.

1973 ක්වූ ඔක්තෝබර් මස 13 වෙනි දින,
මාම්පේ-කැස්බෑව ගම්සභා කාර්යාලයේ දීය.

#### යෝජනාව

ගම්සභා ආඥාපනතේ (257 වන අධිකාරිය වන) 1952 අංක 6 දරණ ප්‍රාදේශාධිකාරි සභා පොදු අදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වෙනි වගන්තියේ 1 වෙනි උප වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ මාම්පේ-කැස්බෑව ගම් සභාව විසින් 1959 ඔක්තෝබර් මස 16 වෙනි දින අංක 11,902 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද යෝජනාවෙන් සම්මත වූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවලියේ IV වෙනි කාණ්ඩයේ 6 වෙනි වගන්තියේ ප්‍රකාර ගම්සභාවේ සභාපතිතුමාගේ ලියවිලි සහිත බලයක් හෝ අවසරයක් නොමැතිව පහත නම් සඳහන් මංමාවත්වල ලොරි, බස් සහ ටොන් 1 1/2 ට වැඩි බර ඇති වෙනත් ඕනෑම වර්ගයක වාහනයක් ධාවනය කිරීම නීති විරෝධී බව 1973 ක්වූ සැප්තැම්බර් මස 28 වෙනි දින පවත්වන ලද මෙම ගම් සභාවේ මාසික සභා රැස්වීමේදී ගම්සභා නියෝජිත පී. අමරසේන ප්‍රනාන්දු සහ ඩබ්ලිව්. සයිනෝරිස් බොතේජු යන මහතුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් පසු ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.

#### මංමාවත්

1. ඇල්තර-කිතලන්දලුව තොටුපල පාර
2. ඇල්තර පඤ්ඤාලෝක මාවත
3. දම්පේ-වැව්වේල්ල පාර
4. බටුවන්දර-මොරඳ පාර
5. හොරතුඩුව-හල්පිට ශ්‍රමදාන මාවත
6. කහපොල රවුම් පාර
7. පැලැන්වත්ත-බලවල පාර
8. කටුවාවල දහයේ කනුව පාර
9. කටුවාවල ඇහැලපේ පාර.

10–902—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### දික්වැල්ල ගම් ප්‍රදේශය

#### දියුණු ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීම

මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ නැගෙනහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත්, දික්වැල්ල ගම් ප්‍රදේශය තුළ පිහිටි පහත උප ලේඛණයේ සඳහන් සීමා ප්‍රදේශය ගම් සභා ආඥාපනත වූ 257 වැනි අධිකාරය 37 (ඒ) වගන්තිය යටතේ, මාතර පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා ගේ අනුමැතිය ඇතිව දියුණු ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පමුණුවා ඇති බව මහ ජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. බී. විල්සන්,
දික්වැල්ල ගම් ප්‍රදේශයේ පරිපාලන නිලධාරි.

1973 ඔක්තෝබර් මස 12 දින,
දික්වැල්ල ගම් ප්‍රදේශයේ පරිපාලන නිලධාරී
කාර්යාලයේදී ය.

#### උපලේඛනය

මාතර-තංගල්ල ප්‍රධාන මාර්ගයේ පිහිටි අංක 112/1 දරණ තොණ්ඩිලේ බෝක්කුවේ සිට මුහුද දක්වාද මුහුදු මායිම දිගේ නැගෙනහිරට පෙහෙඹිය ගම් සහා පාර හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන් සිට පෙහෙඹිය ගම් සභා පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ, මාතර-තංගල්ල මහා මාර්ගය දක්වාද, එතැන් සිට මාතර-තංගල්ල මහා මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට දකුණු දෙසට යාර 100 බැගින් දොඩම්පහල හන්දිය දක්වාද, එම ලක්ෂ්‍යයේ සිට මාතර-තංගල්ල මහා මාර්ගයේ මධ්‍ය රේඛාව සිට උතුරු දෙසට යාර 200 බැගින් දික්වැල්ල මුස්ලිම් වීදිය ග්‍රාම සේවක වසමේ නැගෙනහිර සීමාව හමුවන ස්ථානය දක්වා ද, එම ලක්ෂ්‍යයේ සිට දික්වැල්ලේ මුස්ලිම් වීදිය ග්‍රාම සේවක වසමේ නැගෙනහිර මායිම ඔස්සේ වැලිහිටිය හන්දිය දක්වා ද, එම ලක්ෂ්‍යයේ සිට දෙමටපිටිය අංක 2 දරණ සැකපුම් කණුව දක්වා දික්වැල්ල-බෙලිඅත්ත මහා මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට නැගෙනහිර දෙසට යාර 200 බැගින් ද, එම ලක්ෂ්‍යයේ සිට දික්වැල්ල-බෙලිඅත්ත මහා මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට බටහිර දෙසට යාර 200 බැගින් වලස්ගල හන්දිය දක්වාද, එම ලක්ෂ්‍යයේ සිට වලස්ගල දම්පල පාරේ මධ්‍ය රේඛාවේ සිට යාර 200 බැගින් උතුරු දෙසට බෝගහ හන්දිය දක්වාද, එතැන් සිට වලස්ගල-රදම්පල පාරේ මධ්‍ය රේඛාවේ සිට දකුණු දෙසට යාර 200 බැගින් වලස්ගල හන්දිය දක්වා ද, එම ලක්ෂයේ සිට දික්වැල්ල-බෙලිඅත්ත පාරේ මධ්‍ය රේඛාවේ සිට බටහිර දෙසට යාර 200 බැගින් වැවුරුකන්නල හන්දිය දක්වාද, එතැන් සිට සැන්ඩ්ස් පාර දක්වා වැටෙන ගම් සභා පාර ඔස්සේ සහ සැන්ඩ්ස් පාර රත්මලේ පාරට සම්බන්ධ වන ස්ථානය දක්වා සහ එතැන් සිට දොරේමුරේ ගම්සභා පාර දක්වා දික්වැල්ල-රත්මලේ පාරේ මධ්‍ය රේඛාවේ සිට උතුරු දෙසට යාර 100 බැගින්ද එම අවසාන ලක්ෂ්‍යයේ සිට දික්වැල්ල ඇළ (කලපුව) දක්වා වැටෙන සෘජු රේඛාව දිගේ ඇළ හමුවන ස්ථානය දක්වා සහ එතැන් සිට එම ඇල ඔස්සේ මාතර-තංගල්ල මහා මාර්ගය දක්වා ද, එතැන් සිට එම පාරේ මධ්‍ය රේඛාවේ සිට උතුරු දෙසට යාර 100 ක් දුරින් පිහිටි රේඛාවක් දිගේ පළමුව සඳහන් තොණ්ඩිලේ බෝක්කුව දක්වා ද යන මායිමෙන් වට වූ ප්‍රදේශය.

10–880—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

---

### එප්පාවල ගම් සභාව

#### මස් පිණිස සතුන් මැරීමේ ආඥා පනත

මෙහි පහත සඳහන් උප ලේඛනයේ සඳහන් අය විසින් එප්පාවල ගම් සභා ප්‍රදේශයේ එප්පාවල නගරයේ පිහිටි තාවකාලික මඩුවකදී එළ ගවයන් ඝාතනය කිරීමට සහ ඒ මස් වෙළඳාම් කිරීමට 1973 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා බල පත්‍රයක් ඉල්ලුම් කර ඇති බවත්, මෙම බල පත්‍රය නිකුත් කිරීම ගැන එප්පාවල ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එයට හේතුව ලිපිනය සඳහන් කර ලියවිල්ලකින් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවී දින 7 ක් ඇතුළත මා වෙත ලැබෙන්ට සැලැස්විය යුතු බවත්, මස් පිණිස සතුන් මැරීමක් පිළිබඳ ආඥා පනතේ (272 අධිකාරය) 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් විස්තරය |
| --- | --- |
| ඊ. විල්ෂන් සිල්වා, මැඩියාව, එප්පාවල | එළ ගව්මස් |

ඩී. යූ. ඩී. [illegible],
සභාපති,
එප්පාවල ගම්සභාව.

වර්ෂ 1973 ඔක්තෝබර් මස 2 වැනි දින,
එප්පාවල ගම්සභා කාර්යාලයේදීය.

10–1014—73.10.26 දින අංක 83 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| නොවැම්බර් ... | 73.11. 2 | සිකුරාද | ... | 73.10.26 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.11. 9 | සිකුරාද | ... | 73.11. 2 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.16 | සිකුරාද | ... | 73.11. 9 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.23 | සිකුරාද | ... | 73.11.16 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.11.30 | සිකුරාද | ... | 73.11.23 | සිකුරාද | දහවල් 12.00 |
| දෙසැම්බර් ... | 73.12. 7 | සිකුරාද | ... | 73.11.30 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.14 | සිකුරාද | ... | 73.12. 7 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.21 | සිකුරාද | ... | 73.12.14 | සිකුරාද | දහවල් 12.00 |
| | 73.12.28 | සිකුරාද | ... | 73.12.21 | සිකුරාද | දහවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 අගෝස්තු මස 18 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.